කාර්යසාධන වාර්තාව - 2012

ජාතික අයවැය දෙපාර්තමේන්තුව

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

දැක්ම

රාජ්‍ය සම්පත් කාර්යක්ෂම ලෙස ප්‍රතිපාදනය හා කළමනාකරණය තුළින්
සමාජ ආර්ථික සංවර්ධනය

මෙහෙවර

කාර්යක්ෂම රාජ්‍ය සේවයක් පවත්වා ගැනීම සඳහාත්, රජයේ සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහාත්, අවශ්‍ය සම්පත් ප්‍රතිපාදනය හා බෙදා හැරීම මඟින් රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳව ව්‍යවස්ථාදායකය වෙත පැවරි ඇති වගකීම නිසි අයුරින් ඉටු කිරීම සඳහා සහාය වීම.

කාර්යයන් සහ වගකීම්

අ. වර්ෂ තුනක් සඳහා මධ්‍යකාලීන වියදම් රාමුව සකස් කිරීම සහ එය තුල

- රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ දක්වා ඇති මූල්‍ය ඉලක්ක සාක්ෂාත් කර ගැනීම උදෙසා මුදල් වැය කරන නියෝජිත ආයතන සහ අදාළ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සමඟ සාකච්ඡා කරමින් අමාත්‍යාංශ, රාජ්‍ය දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම.

ආ. රාජ්‍ය වියදම් කළමනාකරණය

- අයවැය චක්‍රලේඛ නිකුත් කිරීම.
- අනුමත සීමාවන් ඇතුළත ප්‍රකාශිත කාර්යයන් සඳහා පමණක් අරමුදල් වැය කිරීම. සහතික කරනු ලැබීම සඳහා සීමා පැනවීම.
- වියදම් කරනු ලබන කාර්යයන්හි ඵලදායිතාවය සහතික කරනු සඳහා මුදල් වැය කරන නියෝජිත ආයතනය සමඟ සාකච්ඡා කර කටයුතු කිරීම.
- මූල්‍ය මෙන්ම භෞතික ප්‍රගතිය අධීක්ෂණය සඳහා වියදම් විශ්ලේෂණය කිරීම.
- පාර්ලිමේන්තුවේ ගිණුම් කාරක සභාව නියෝජනය කිරීම.
- වාහන ප්‍රසම්පාදනය සඳහා අනුමැතිය ලබාදීම.
- අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳ නිරීක්ෂණ සකස් කිරීම.
- මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ රාජ්‍ය ආයතන සඳහා වාහන ප්‍රසම්පාදනය කිරීම.
- දෙපාර්තමේන්තුවේ මූල්‍ය පරිපාලනය
- අධ්‍යක්ෂ මණ්ඩල සහ අනෙකුත් කමිටු සඳහා කාර්ය මණ්ඩල සහභාගිත්වය.

ඇ. ව්‍යවස්ථාපිත මණ්ඩලවල අදාළ කටයුතු (වාණිජමය නොවන රාජ්‍ය ආයතන)

- වාණිජමය නොවන ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම.
- පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර කාරක සභාව නියෝජනය කිරීම.

ඈ. අත්තිකාරම් ගිණුම් ක්‍රියාකාරකම්

- මුදල් වැයකරන නියෝජිත ආයතන සමග සාකච්ඡා කර වාණිජමය, ගබඩා සහ රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සංශෝධනය කිරීමේ ඉල්ලීම් සලකා බැලීම
- අත්තිකාරම් ගිණුම් සීමාවන් නොපිළිපැදීම සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ රැස්වීම්වලදී භාණ්ඩාගාරය නියෝජනය කිරීම.

පටුන

පරිච්ඡේද අංකය		විෂය මාතෘකාව	පිටුව
1		**සාරාංශය**	
	1.1	මෙහෙයුම් කාර්ය රාමුව	01
2		**2012 අයවැය ක්‍රියාත්මක කිරීම**	
	2.1	2012 වර්ෂය සඳහා වූ විසර්ජන පනත	04
	2.2	කාර්යසාධනය 2012	04
	2.3	2012 වර්ෂයේ රාජ්‍ය වියදම් ව්‍යාප්තිය	11
	2.4	2012 - 2014 මධ්‍යකාලීන වියදම් රාමුව තුළ 2012 අයවැයෙහි ආශීය දැක්ම	11
	2.5	2012 ආංශීය වියදම් පිළිබඳව විශ්ලේෂණය	11
		මානව සම්පත් සංවර්ධනය	12
		යටිතල පහසුකම් සංවර්ධනය	14
		මූර්ත ආර්ථිකය	17
	2.6	සුබසාධන වියදම් සහ සංවර්ධන සහනාධාර සඳහා රාජ්‍ය වියදම	20
	2.7	2012 අයවැය කළමනාකරණය	21
	2.7.1	රාජ්‍ය ගිණුම්වලට අනුව ආදායම වියද	21
	2.7.2	රාජ්‍ය වියදම් කළමනාකරණය	23
	2.7.3	මූල්‍ය බැදීම් කළමනාකරණය	23
	2.7.4	අයවැය චක්‍රලේඛය නිකුත් කිරීම	24
	2.7.5	පරිපූරක ඇස්තමේන්තුව	24
	2.8	අත්තිකාරම් ගිණුම් අධීක්ෂණය	25
3		**2013 වසර සඳහා අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම**	**25**
	3.1	අයවැය සම්පාදනය කිරීමේ මාර්ගෝපදේශ	25
4		**විශේෂ ක්‍රියාකාරකම්**	25
	4.1	වාණිජමය නොවන රාජ්‍ය ව්‍යාපාරයන්හි අයවැය කළමනාකරණය	26
	4.2	අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ	27
	4.3	2012 දැයට කිරුළ සංවර්ධන වැඩසටහන සම්බන්ධීකරණය කිරීම	27
	4.4	වාහන මිලදී ගැනීම සඳහා අනුමැතිය	27
	4.4.1	වාහන ප්‍රසම්පාදන සඳහා ජාතික අයවැය අනුමැතිය	27
	4.4.2	මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ රාජ්‍ය ආයතන වෙත සපයන ලද වාහන	27
	4.5	අධ්‍යක්ෂ මණ්ඩල හා කමිටු සඳහා නිලධාරී සහභාගිත්වය	28
5		**ජාතික අයවැය ඇස්තමේනතුවේ සංවිධාන ව්‍යුහය හා කාර්යභාරය**	28
	5.1	කාර්ය මණ්ඩලය	28
	5.2	මානව සම්පත් සංවර්ධනය	29
	5.2.1	විදේශ පුහුණුව / සම්මන්ත්‍රණ /රැස්වීම්	29
	5.2.2	දේශීය පුහුණුව	30
	5.3	ජාතික අයවැය ඇස්තමේන්තුවේ මූල්‍යමය පාලනය	31
	5.3.1	ශීර්ෂ 240 යටතේ වියදම් සාරාංශය	32
	5.3.2	ව්‍යාපෘති අනුව 2012 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන සහ සත්‍ය වියදම	32
	5.3.3	2012 වර්ෂය සඳහා විගණකාධිපතිගේ විගණන විමසුම	34

01. සාරාංශය

ජාතික අයවැය දෙපාර්තමේන්තුව, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ මඟපෙන්වීම යටතේ කටයුතු කරන ආයතනයකි. සමස්ත මධ්‍යකාලීන සාර්ව ආර්ථික රාමුව සමග අනුගත වෙමින්, ආංශයීය මධ්‍යකාලීන වියදම් රාමුව පාදක කොට අයවැය ඇස්තමේන්තු සම්පාදනය කිරීමේ කේන්ද්‍රස්ථානය වශයෙන් දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබේ. රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීමෙහිලා විශේෂ අවධානය යොමු කරමින්, ආංශයීය ප්‍රතිපත්ති සහ උපායමාර්ග සන්දර්භය තුල විශේෂිත වූ ඉලක්ක කරා ලගාවීම සඳහා වූ මූල්‍ය සැලසුම් මෙම මධ්‍යකාලීන වියදම් රාමුව මගින් ඉදිරිපත් කර ඇත. මෙම ක්‍රියාවලියෙහිදී අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රජයේ ව්‍යවස්ථාපිත ආයතන සහ අදාළ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු වෙතින් නිරන්තරව අදහස් ලබා ගැනීම සිදු කරයි.

1.1 මෙහෙයුම් කාර්ය රාමුව

මෙම දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වල කාර්ය සාධනය, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ සහ සැලසුම් සම්බන්ධ පුළුල් විෂය රාමුව සහ මෙම දෙපාර්තමේන්තුවට අදාළ වන සමස්ත කාර්යභාරය මත පදනම් වේ. පහත වගු අංක 1.1 හි දක්වා ඇති පරිදි, 2013 - 2015 මධ්‍යකාලීන වියදම් රාමුව 2013 වාර්ෂික අයවැය සකස් කිරීමේදී 2012 වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් පුළුල් පරාසයක ක්‍රියාදාමයන් රැසක් ඉටු කර ඇත.

1.1 වගුව

කාර්ය සාධන සාරාංශය - 2012 වර්ෂය

කාර්යය	ක්‍රියාකාරකම	සමස්ත ඉලක්කය	සාක්ෂාත් කර ගත් අරමුණු
1. 2012 අයවැය ක්‍රියාත්මක කිරීම සහ වියදම් කළමනාකරණය.	• වියදම් කළමනාකරණය සම්බන්ධ උපදෙස් සහිත අයවැය චක්‍රලේඛ නිකුත් කිරීම.	• රාජ්‍ය වියදම් ඵලදායී ලෙස කළමනාකරණය.	• අංක 156 සහ 157 දරණ ජාතික අයවැය චක්‍රලේඛ මේ සම්බන්ධයෙන් නිකුත් කිරීම.
	• අනපේක්ෂිත වියදම් සහ නව ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම සඳහා අතිරේක ප්‍රතිපාදන ලබාදීම	• අනපේක්ෂිත වියදම් අවම කිරීම	• පාර්ලිමේන්තුවට පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීමකින් තොරව ජලගැලීම්, නියගය සහ අනෙකුත් අවශ්‍යතා සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අනුමත වියදම් සීමාව තුල කළමනාකරණය කරන ලදී.
	• මු.රෙ.66 සහ මු.රෙ.69 යටතේ ප්‍රතිපාදන මාරු කිරීම සඳහා බලය පැවරීම	• අනුමත වැය ඇස්තමේන්තු තුල වියදම් කළමනාකරණය කිරීම	• මුදල් රෙගුලාසි අනුව, ඉදිරිපත් වූ ඉල්ලුම්පත් 1,886 ක් සඳහා බලය ලබාදෙන ලදී. ඉන් 184 ක් වැඩසටහන් අතර මාරු කිරීම් වන අතර, 1,702 ක් ව්‍යාපෘති අතර මාරු කිරීම් විය.
2. 2013 වර්ෂය සඳහා ජාතික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම	• අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සම්බන්ධ අයවැය මාර්ගෝපදේශ නිකුත් කිරීම. • මුදල් වැය කරන ආයතන හා අදාල භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සමග සාකච්ඡා කිරීමෙන් වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල කෙටුම්පත් සකස් කිරීම	• අයවැය ඇස්තමේන්තු සකස් කිරීමට අදාල මාර්ගෝපදේශ සමග අදාල අමාත්‍යාංශ සඳහා ලිපි නිකුත් කිරීම. • රජයේ අනාගත දැක්ම හා රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුව මගින් පෙන්වා දුන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම	• වියදම් දරන නියෝජිතායතන වෙත මාර්ගෝපදේශ ලිපි නිකුත් කරන ලදී. • 2013-2015 මධ්‍යකාලීන වියදම් රාමුව ඇතුලත, රජයේ සංවර්ධන ප්‍රතිපත්ති අනුව යමින් 2013 වර්ෂය සඳහා වියදම් අයවැය සකස් කරන ලදී.

කාර්යය	ක්‍රියාකාරකම	සමස්ත ඉලක්කය	සාක්ෂාත් කර ගත් අරමුණු
	• අදාල අමාත්‍යාංශ සමග අයවැය සාකච්ඡා පැවැත්වීම	• සත්‍ය අවශ්‍යතා හඳුනාගෙන තාත්වික අයවැයක් සකස් කිරීම	• අතිගරු ජනාධිපතිතුමාගේ සභාපතිත්වයෙන් තෝරාගත් අමාත්‍යාංශ සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමග පූර්ව අයවැය රැස්වීම් පැවැත්වීම. • අදාල අමාත්‍යාංශවල ගරු අමාත්‍යවරයාගේ සභාපතිත්වය සහිත රැස්වීම් පැවැත්වීම.
	• විසර්ජන පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.	• විසර්ජන පනත් කෙටුම්පත් 2012 ඔක්තෝම්බර් තෙවන සතියේදී ඉදිරිපත් කිරීමට කටයුතු යෙදීම. • සවිස්තරාත්මක මුද්‍රිත ඇස්තමේන්තු සකස් කිරීම. • විසර්ජන කෙටුම්පත පාර්ලිමේන්තු සම්මත කරගැනීම.	• 2012.10.28 දිනැති ගැසට් නිවේදනය යටතේ විසර්ජන පනත් කෙටුම්පත ගැසට් කිරීම. • විශ්ලේෂණාත්මක දත්ත සමග සවිස්තරාත්මක මුද්‍රිත ඇස්තමේන්තු සකස් කිරීම. • 2012.10.26 දින විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට යොමු කරන ලදී. • 2012.11.08 වැනි දින දෙවන වර කියවීම සඳහා අයවැය ඇස්තමේන්තුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. • 2012.12.08 දින විසර්ජන කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත විය. • 2012.12.08 දින ගරු කථානායකතුමා විසින් 2012 අංක 23 දරණ විසර්ජන පනත සහතික කරන ලදී.
3. ප්‍රතිපත්ති හා වියදම් සමාලෝචනය.	• අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවලට නිරීක්ෂණ සැපයීම.	• රාජ්‍ය / ආංශීය ප්‍රතිපත්ති හා වියදම් සමාලෝචනය කරමින් අමාත්‍ය මණ්ඩල සඳහා නිරීක්ෂණ නියමිත කාලයට සැපයීම.	• අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 256 ක් සඳහා නිරීක්ෂණ සපයා ඇති අතර අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 240 ක් සඳහා නිරීක්ෂණ අනෙකුත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සඳහා සපයන ලදී.

කාර්යය	ක්‍රියාකාරකම	සමස්ත ඉලක්කය	සාක්ෂාත් කර ගත් අරමුණු
4. ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර කළමනාකරණ කටයුතු.	• සාමාන්‍ය පරිපාලනය.	• දෙපාර්තමේන්තුවට සපයන ලද ප්‍රතිපාදනවල හා මානව සම්පත්හි සාඵල්‍ය භාවිතය සහතික කිරීම.	• රු.මි. 1,477.9 ක් භාවිතා කරන ලද අතර ඉන් රු.මි. 68.5 ක් පුනරාවර්තන වියදම් වන අතර රු.මි. 1,409.4 මූලධන වියදම් ලෙස භාවිතා කරන ලදී.
	• දෙපාර්තමේන්තුවේ අත්තිකාරම් ගිණුම් පාලනය.	• අත්තිකාරම් ගිණුම්වල සීමාවන් සමග ගැලපෙන පරිදි ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සෑම අයදුම්කරුවෙකුටම ණය ප්‍රදාන / අත්තිකාරම් ලබාදීම	• නිලධාරීන් සඳහා ආපදා ණය, පාපැදි ණය, විශේෂ අත්තිකාරම් හා උත්සව අත්තිකාරම් ලබාදෙන ලද අතර එහි මුළු වටිනාකම රු.3,968,834 කි.
	• හැකියා ප්‍රවර්ධනය.	• දෙස්, විදෙස් පුහුණු වැඩසටහන් හරහා මානව සම්පත් සංවර්ධනය.	• ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ කටයුතුවලට අදාල වන වැඩසටහන් සම්බන්ධයෙන් නිලධාරීන් 10 කට විදේශ පුහුණුව ලබාදෙන අතර නිලධාරීන් 14 කට දේශීය පුහුණුව ලබාදෙන ලදී.
	• වාර්තා ඉදිරිපත් කිරීම.	• නියමිත දිනට පෙර වාර්තා ඉදිරිපත් කිරීම.	• පහත දැක්වෙන වාර්තා නියමිත කාලසීමාවේදී ඉදිරිපත් කරන ලදී. (අ) 2011කාර්ය සාධන වාර්තාව (ආ) 2011 විසර්ජන ගිණුම
	• විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම.	• විගණන විමසුම් අවම කිරීම.	• විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 7 ක් සඳහා පිළිතුරු සපයා ඇත.

2. 2012 අයවැය ක්‍රියාත්මක කිරීම

2.1 2012 වර්ෂය සඳහා වූ විසර්ජන පනත

2011.10.18 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද විසර්ජන පනත් කෙටුම්පත අනුව 2012 වර්ෂය සඳහා රජයේ මුළු ඇස්තමේන්තුගත වියදම, අත්තිකාරම් ගිණුම් කටයුතු ද ඇතුළුව රු.මිලියන 2,224 ක් විය. එසේම උපරිම ණය සීමාව රු.බිලියන 1,150 ක් විය. රජයේ මුළු වියදම පහත සඳහන් පරිදි වේ.

- රජයේ පොදු සේවාවලට අදාල වියදම - රු.බිලියන 1,284
- විශේෂ නීති මගින් ඒකාබද්ධ අරමුදලට වැය බරක් වියයුතු බවට දැනටමත් බලය දී ඇති වියදම - රු.බිලියන 936
- රජයේ අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා වියදම - රු.බිලියන 4

අතිගරු ජනාධිපතිතුමා මුදල් අමාත්‍යවරයා ලෙස අයවැය කථාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන අවස්ථාවේදී පුනරාවර්තන වියදම් තුලින් සියයට 2 ක ප්‍රතිශතයක් සහ ප්‍රාග්ධන වියදම්වලින් සියයට 9 ක ප්‍රතිශතයක් අනිවාර්ය ඉතිරිකිරීම් ලෙස පවත්වා ගතයුතු බවට යෝජනා කරන ලදී. ඒ අනුව, පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද රජයේ සමස්ත වියදම රුපියල් බිලියන 2,194 දක්වා අඩු විය. අයවැය මගින් ඉදිරිපත් කරන ලද ආදායම් සහ වියදම් යෝජනා සළකා බැලීමෙන් පසුව 2012 වර්ෂය සඳහා රාජ්‍ය ණයගැනීමේ අවශ්‍යතාවය රුපියල් බිලියන 1,150 සිට රුපියල් බිලියන 1,139 දක්වා අඩු කෙරිණි. 2012 මුදල් වර්ෂය සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත 2011 දෙසැම්බර් මස 11 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීමෙන් අනතුරුව කථානායකතුමා විසින් සහතික කිරීමෙන් පසු පනතක් බවට පත්විය. (2011 අංක 52 දරණ විසර්ජන පනත)

2.2 කාර්ය සාධනය - 2012

වැය ශීර්ෂ අනුව වෙන් කෙරුණු ප්‍රතිපාදන වැඩසටහන්, ව්‍යාපෘති හා වැය විෂයයන් යටතේ තවදුරටත් වර්ගීකරණය කර, ඒවා මුල්‍යායනය කෙරෙන ප්‍රභවයන් ද (දේශීය අරමුදල්, විදේශ ණය /ප්‍රදාන ආදී) සමග මුද්‍රිත අයවැය ඇස්තමේන්තුවල දැක්වේ. එම මුද්‍රිත ඇස්තමේන්තු අයවැය කථාව සමග අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කෙරේ.

විසර්ජන පනත් කෙටුම්පත පනතක් ලෙස පාර්ලිමේන්තුව මගින් සම්මත කිරීමෙන් අනතුරුව මුදල් අමාත්‍යවරයා විසින් මුද්‍රිත අයවැය ඇස්තමේන්තුවල දැක්වෙන පරිදි වියදම් දැරීම සඳහා අවශ්‍ය අධිකාරී බලය වොරන්ට් බලපත්‍රයක් මගින් නිකුත් කරනු ලැබේ.2012 වර්ෂය සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද අයවැය ඇස්තමේන්තුවට අනුව වැය ශීර්ෂ 201 ක් සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත. විශේෂ වියදම් ඒකක 22 ක් අමාත්‍යාංශ 54 ක් සහ දෙපාර්තමේන්තු 125 ක් ඊට අයත් විය.

විසර්ජන පනතේ 5 වෙනි වගන්තිය හා මුදල් රෙගුලාසි ප්‍රකාරව, 2012 වර්ෂය තුල රුපියල් බිලියන 12.8 ක මූලධන වියදම් සඳහා වූ අතිරේක ප්‍රතිපාදන අවශ්‍යතාවය පුනරාවර්තන වියදම් සඳහා වූ ප්‍රතිපාදන මාරු කිරීම තුලින් කළමනාකරණය කරගැනීමට සමත් විය. ණය සේවා ගෙවීම් සඳහා අමතර ප්‍රතිපාදන ලෙස රුපියල් බිලියන 73.4 ක් ලබාදෙන ලදී. ණය සේවා ගෙවීම්, විශේෂ නීති යටතේ දැනටමත් අනුමැතිය ලැබී ඇති වියදම් වන බැවින් අමතර ප්‍රතිපාදන ලබාදීම සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය අවශ්‍ය නොවේ. එබැවින්, මුදල් අමාත්‍යවරයා විසින් වොරන්ට් බලපත්‍රයක් නිකුත් කිරීම මගින් අමතර ප්‍රතිපාදන ලබාදී ඇත. ඒ අනුව, 2012 වසර සඳහා වෙන් කෙරුණු සමස්ත ප්‍රතිපාදන ප්‍රමාණය, රජයේ අත්තිකාරම් ගිණුම් කටයුතු හැර, රුපියල් බිලියන 2,268 ක් විය.

2012 වසර සඳහා වාර්තා වූ සමස්ත රජයේ වියදම රුපියල් බිලියන 2,192 ක් විය. ඒ අනුව, 2012 වසරේ දී උපයෝජනය නොවුණු අයවැය ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් බිලියන 73 ක් හෙවත්, මුළු අයවැය ප්‍රතිපාදන ප්‍රමාණයෙන් සියයට 3 කි. මින්, රුපියල් බිලියන 13 ක් පුනරාවර්තන වියදම් සඳහා වෙන් කෙරුණු ප්‍රතිපාදන වූ අතර, ඉතිරි රුපියල් බිලියන 60 ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කෙරුණු ප්‍රතිපාදන විය. මෙවැනි ප්‍රතිපාදන ප්‍රමාණයක් ඉතිරි වුව ද, රජයේ සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතනවල සම්පත් රජයේ සංවර්ධන උපාය මාර්ග කෙරෙහිම ඉලක්කගත කර යොමු කිරීම තුලින් 2012 වර්ෂය සඳහා අයවැය මගින් ඉලක්ක කෙරුණු කාර්යයන් ඉටුකර ගැනීමට සමත් වී ඇත. 2012 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන භාවිතය පිළිබඳව විස්තර වගුව 2.1 මගින් දක්වා ඇත.

2.1 අයවැය ප්‍රතිපාදන භාවිතය -2012

අමාත්‍යාංශයේ නම	පුනරාවර්ථන							ප්‍රාග්ධන						
	මුල් ඇස්තමේන්තුව (1)	2 % ඉතිරිකිරීම් (2)	භාණ්ඩාගාර විවිධ වැය විෂයේ අතිරේක ප්‍රතිපාදන සැලසීම (3)	මු.රෙ. අනුව ප්‍රාග්ධන වියදම් සඳහා මාරුකිරීම් (4)	මුළු ප්‍රතිපාදනය (සංශෝධිත) (1)+ (2)+ (3)+ (4) (5)	උපයෝජනය කරන ලද ප්‍රතිපාදන (6)	උපයෝජනය නොවූ ප්‍රතිපාදනය (5)- (6) (7)	මුල් ඇස්තමේන්තුව (1)	9 % ඉතිරිකිරීම් (2)	භාණ්ඩාගාර විවිධ වැය විෂය මගින් අතිරේක ප්‍රතිපාදන සැලසීම (3)	මු.රෙ. අනුව ප්‍රාග්ධන වියදම් සඳහා මාරුකිරීම් (4)	මුළු ප්‍රතිපාදනය (සංශෝධිත) (1)+ (2)+ (3)+ (4) (5)	උපයෝජනය කරන ලද ප්‍රතිපාදන (6)	උපයෝජනය නොවූ ප්‍රතිපාදනය (7)
විශේෂ වියදම් ඒකක	7,464	64	1,694	-	9,094	8,869	225	4,300	374	529	-	4,455	2,722	1,733
බුද්ධ ශාසන හා ආගමික කටයුතු	843	15	148	-	976	814	162	1,030	74	21	-	977	709	268
මුදල් හා ක්‍රමසම්පාදන	11,132	90	1,907	(13)	12,936	11,078	1,858	9,624	727	5,505	13	14,415	13,269	1,146
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන	215,427	187	6,596	-	221,836	220,743	1,093	15,816	768	6,447	-	21,495	17,830	3,665
ආර්ථික සංවර්ධනය	18,547	30	2,798	(4.0)	21,311	21,160	151	86,024	7,717	140	4	78,451	72,663	5,788
ආපදා කළමනාකරණ	635	8	27	(56)	598	555	43	784	71	64	56	834	558	276
තැපැල් සේවා	7,853	17	497	-	8,333	8,333	-	346	35	10	-	321	235	86
අධිකරණ	3,418	12	464	(7)	3,863	3,836	27	819	74	234	7	986	920	66
සෞඛ්‍යය	55,000	-	4,258	-	59,258	57,859	1,399	19,500	1,755	121	-	17,866	13,647	4,219

අමාත්‍යාංශයේ නම	පුනරාවර්තන							ප්‍රාග්ධන						
	මුල් ඇස්තමේන්තුව	2 % ඉතිරිකිරීම්	භාණ්ඩාගාර විවිධ වැය විෂයේ අතිරේක ප්‍රතිපාදන සැලසීම	මු.රෙ. අනුව ප්‍රාග්ධන වියදම් සඳහා මාරුකිරීම්	මුළු ප්‍රතිපාදනය (සංශෝධිත) (1)+ (2)+ (3)+ (4)	උපයෝජනය කරන ලද ප්‍රතිපාදන	උපයෝජනය නොවූ ප්‍රතිපාදනය (5)- (6)	මුල් ඇස්තමේන්තුව	9 % ඉතිරිකිරීම්	භාණ්ඩාගාර විවිධ වැය විෂය මගින් අතිරේක ප්‍රතිපාදන සැලසීම	මු.රෙ. අනුව ප්‍රාග්ධන වියදම් සඳහා මාරුකිරීම්	මුළු ප්‍රතිපාදනය (සංශෝධිත) (1)+ (2)+ (3)+ (4)	උපයෝජනය කරන ලද ප්‍රතිපාදන	උපයෝජනය නොවූ ප්‍රතිපාදනය
විදේශ කටයුතු	5,700	-	1,630	-	7,330	7,305	25	940	13	264	-	1,191	995	196
ප්‍රවාහන	13,540	271	2,734	(2)	16,001	15,844	157	40,000	4	385	2	40,383	32,010	8,373
ඛනිජ තෙල් කර්මාන්ත	101	2	-	-	99	94	5	7	1	3	-	10	6	4
සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ	707	10	430	-	1,127	1,067	60	600	50	4	-	554	211	343
වරාය හා මහා මාර්ග	200	-	-	(3)	198	196	2	144,367	-	3,396	3	147,766	146,682	1,084
කෘෂිකර්ම	2,381	13	54	(3)	2,419	2,391	28	3,708	327	-	3	3,384	2,829	555
විදුලිබල සහ බලශක්ති	1,083	22	-	(9)	1,053	459	594	32,500	852	707	9	32,365	32,207	158
ළමා සංවර්ධන හා කාන්තා කටයුතු	734	6	42	(1)	769	717	52	215	19	48	1	245	201	44
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු	135,954	80	4,944	-	140,818	140,538	280	2,000	180	876		2,696	2,221	475
ජනමාධ්‍ය හා තොරතුරු	1,658	33	277	(1)	1,901	1,848	53	447	40	14	1	422	235	187
ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස හා මහජන උපයෝගිතා	712	8	37	-	741	708	33	2,075	201	194	-	2,068	1,734	334

අමාත්‍යාංශයේ නම	පුනරාවර්ථන							ප්‍රාග්ධන						
	මුල් ඇස්තමේන්තුව	2 % ඉතිරිකිරීම්	භාණ්ඩාගාර විවිධ වැය විෂයේ අතිරේක ප්‍රතිපාදන සැලසීම	මු.රෙ. අනුව ප්‍රාග්ධන වියදම් සඳහා මාරුකිරීම්	මුළු ප්‍රතිපාදනය (සංශෝධිත) (1)+ (2)+ (3)+ (4)	උපයෝජනය කරන ලද ප්‍රතිපාදන	උපයෝජනය නොවූ ප්‍රතිපාදනය (5)- (6)	මුල් ඇස්තමේන්තුව	9 % ඉතිරිකිරීම්	භාණ්ඩාගාර විවිධ වැය විෂය මගින් අතිරේක ප්‍රතිපාදන සැලසීම	මු.රෙ. අනුව ප්‍රාග්ධන වියදම් සඳහා මාරුකිරීම්	මුළු ප්‍රතිපාදනය (සංශෝධිත) (1)+ (2)+ (3)+ (4)	උපයෝජනය කරන ලද ප්‍රතිපාදන	උපයෝජනය නොවූ ප්‍රතිපාදනය
සමාජ සේවා	914	5	594	(1)	1,501	1,472	29	204	16	1	1	191	103	88
අධ්‍යාපන	27,250	6	1,790	-	29,034	28,977	57	6,016	3	551	-	6,564	4,641	1,923
කම්කරු හා කම්කරු සබඳතා	1,120	22	12	-	1,110	1,089	21	400	23	20	-	398	329	69
සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යාවසාය සංවර්ධන	522	10	4	-	517	507	10	300	15	123	-	409	327	82
පළාත් පාලන හා පළාත් සභා	95,059	1,899	1,149	-	94,309	92,059	2,250	34,714	2,950	4,330	-	36,094	25,566	10,528
තාක්ෂණ හා පර්යේෂණ	1,149	23	-	-	1,126	1,058	68	2,027	182	13	-	1,858	1,125	733
ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා	253	5	35	(1)	282	234	48	183	12	3	1	175	136	39
වැවිලි කර්මාන්ත	1,882	15	9	(2)	1,873	1,487	386	1,194	56	11	2	1,152	776	376
ක්‍රීඩා	552	11	0	-	541	483	58	1,542	139	7	-	1,410	880	530
දේශීය වෛද්‍ය	787	16	29	-	800	764	36	477	43	99	-	533	300	233
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන	821	14	227	(2)	1,032	1,019	13	2,248	198	580	2	2,632	1,967	665
පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා	449	9	11	(10)	441	439	2	2,239	182	204	10	2,271	2,105	166

අමාත්‍යාංශයේ නම	පුනරාවර්ථන							ප්‍රාග්ධන						
	මුල් ඇස්තමේන්තුව	2 % ඉතිරිකිරීම්	භාණ්ඩාගාර විවිධ වැය විෂයේ අතිරේක ප්‍රතිපාදන සැලසීම	මු.රෙ. අනුව ප්‍රාග්ධන වියදම් සඳහා මාරුකිරීම්	මුළු ප්‍රතිපාදනය (සංශෝධිත) (1)+ (2)+ (3)+ (4)	උපයෝජනය කරන ලද ප්‍රතිපාදන	උපයෝජනය නොවූ ප්‍රතිපාදනය (5)- (6)	මුල් ඇස්තමේන්තුව	9 % ඉතිරිකිරීම්	භාණ්ඩාගාර විවිධ වැය විෂය මගින් අතිරේක ප්‍රතිපාදන සැලසීම	මු.රෙ. අනුව ප්‍රාග්ධන වියදම් සඳහා මාරුකිරීම්	මුළු ප්‍රතිපාදනය (සංශෝධිත) (1)+ (2)+ (3)+ (4)	උපයෝජනය කරන ලද ප්‍රතිපාදන	උපයෝජනය නොවූ ප්‍රතිපාදනය
සංවර්ධන														
ජාතික උරුමයන්	754	6	32	-	780	724	56	822	57	3	-	768	481	287
පාර්ලිමේන්තු කටයුතු	322	6	25	-	341	341	-	37	73	-	-	-37	21	-58
නැවත පදිංචි කිරීම	273	5	-	(47)	221	200	21	209	19	154	47	391	346	45
කර්මාන්ත හා වාණිජ	751	14	-	-	737	656	81	1,249	112	16	-	1,152	494	658
වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ	3,335	5	75	-	3,405	3,299	106	32,500	2,651	1,000	-	30,849	28,155	2,694
ඉඩම් හා ඉඩම් සංවර්ධන	2,393	6	38	(2)	2,423	2,416	7	2,815	253	197	2	2,761	2,235	526
යෞවන කටයුතු හා නිපුණතා සංවරධන	3,917	92	60	-	3,885	3,778	107	4,700	423	17	-	4,294	3,269	1,025
පරිසර	1,400	14	21	(2)	1,405	1,329	76	2,017	182	34	2	1,871	955	916
ජලසම්පාදන හා ජලාපවාහන	156	2	36	-	190	169	21	33,000	2,988	2,480	-	32,492	31,110	1,382
උසස් අධ්‍යාපන	15,716	314	6	-	15,408	15,333	75	8,754	658	236	-	8,332	5,553	2,779
රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ	86	2	-	(3)	81	64	17	100	2	-	3	101	36	65
පුනරුත්ථාපන හා බන්ධනාගාර	3,769	75	103	(80)	3,717	3,627	90	553	42	50	80	641	421	220

අමාත්‍යාංශයේ නම	පුනරාවර්ථන							ප්‍රාග්ධන						
	මුල් ඇස්තමේන්තුව	2 % ඉතිරිකිරීම්	භාණ්ඩාගාර විවිධ වැය විෂයේ අතිරේක ප්‍රතිපාදන සැලසීම	මු.රෙ. අනුව ප්‍රාග්ධන වියදම් සඳහා මාරුකිරීම්	මුළු ප්‍රතිපාදනය (සංශෝධිත) (1)+ (2)+ (3)+ (4)	උපයෝජනය කරන ලද ප්‍රතිපාදන	උපයෝජනය නොවූ ප්‍රතිපාදනය (5)- (6)	මුල් ඇස්තමේන්තුව	9 % ඉතිරිකිරීම්	භාණ්ඩාගාර විවිධ වැය විෂය මගින් අතිරේක ප්‍රතිපාදන සැලසීම	මු.රෙ. අනුව ප්‍රාග්ධන වියදම් සඳහා මාරුකිරීම්	මුළු ප්‍රතිපාදනය (සංශෝධිත) (1)+ (2)+ (3)+ (4)	උපයෝජනය කරන ලද ප්‍රතිපාදන	උපයෝජනය නොවූ ප්‍රතිපාදනය
ප්‍රතිසංස්කරණ														
රාජය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන	107	2	4	(2)	106	97	9	105	2	4	2	108	32	76
සිවිල් ගුවන් සේවා	87	2	-	(1)	84	78	6	12,007	1	2,822	1	14,829	14,801	28
සංස්කෘතික හා කලා කටයුතු	810	12	12	-	810	761	49	703	63	34	-	673	438	235
පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන	564	11	4	-	556	536	20	1,200	90	18	-	1,128	555	573
ගොවිජන සේවා හා වනජීවී	37,541	4	2,779	-	40,316	40,316	-	1,437	129	275	-	1,583	1,074	509
සුළු අපනයන භෝග ප්‍රවර්ධන	443	4	-	-	439	391	48	281	25	32	-	288	264	24
ඵලදායිතා ප්‍රවර්ධන	259	5	562	-	816	808	8	105	9	7	-	103	76	27
විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභ සාධන	82	2	2	-	83	70	13	310	28	-	-	282	28	254
මහජන සම්බන්ධතා හා මහජන කටයුතු	49	-	-	-	49	49	-	110	10	1	-	101	86	15
පුද්ගලික ප්‍රවාහන සේවා	479	10	2	-	472	235	237	229	-	19	-	248	66	182
විදුලි සංදේශ හා	59	1	7		66	66	-	9	-	450	-	459	455	4

අමාත්‍යාංශයේ නම	පුනරාවර්ථන							ප්‍රාග්ධන						
	මුල් ඇස්තමේන්තුව	2 % ඉතිරිකිරීම්	භාණ්ඩාගාර විවිධ වැය විෂයේ අතිරේක ප්‍රතිපාදන සැලසීම	මු.රෙ. අනුව ප්‍රාග්ධන වියදම් සඳහා මාරුකිරීම්	මුළු ප්‍රතිපාදනය (සංශෝධිත) (1)+ (2)+ (3)+ (4)	උපයෝජනය කරන ලද ප්‍රතිපාදන	උපයෝජනය නොවූ ප්‍රතිපාදනය (5)- (6)	මුල් ඇස්තමේන්තුව	9 % ඉතිරිකිරීම්	භාණ්ඩාගාර විවිධ වැය විෂය මගින් අතිරේක ප්‍රතිපාදන සැලසීම	මු.රෙ. අනුව ප්‍රාග්ධන වියදම් සඳහා මාරුකිරීම්	මුළු ප්‍රතිපාදනය (සංශෝධිත) (1)+ (2)+ (3)+ (4)	උපයෝජනය කරන ලද ප්‍රතිපාදන	උපයෝජනය නොවූ ප්‍රතිපාදනය
තොරතුරු තාක්ෂණ														
භාණ්ඩාගාර විවිධ වැය විෂයය	51,800	-	-	(12,591)	505	-	505	21,100	-	-	12,591	941	-	941
රාජ්‍ය ණය සේවා ගෙවීම් රහිතව මුළු ඇස්තමේන්තුව	**739,000**	**3,494**	**36,162**	**(12,843)**	**720,122**	**709,345**	**10,777**	**541,000**	**24,917**	**32,750**	**12,843**	**528,925**	**471,090**	**57,835**
රාජ්‍ය ණය සේවා ගෙවීම්	370,000	-	40,822	-	410,822	408,987	1,835	570,000	-	35,129	-	605,129	**602,814**	**2,315**
මුළු එකතුව	**1,109,000**	-	**76,984**	**(12,843)**	**1,130,944**	**1,118,332**	**12,612**	**1,111,000**	-	**67,879**	**12,843**	**1,134,054**	**1,073,904**	**60,150**

2.3 2012 වර්ෂයේ රාජ්‍ය වියදම් ව්‍යාප්තිය

2012 වර්ෂයේදී පොලී රහිත රාජ්‍ය වියදම රු.බි. 1,167 ක් වූ අතර, එය මුළු රාජ්‍ය වියදමින් සියයට 74 කි. එය දළ දේශීය නිෂ්පාදනය සමග සැසඳීමේදී සියයට 15.4 කි. රාජ්‍ය ආරක්ෂක වියදම සඳහා වූ රු.බි. 563 ක් වූ පුනරාවර්තන වියදම සහ රු.බි. 444 ක්වූ ප්‍රාග්ධන වියදම එනම් රු.බි. 1,007 ක් වූ වියදම මෙම වියදමට ඇතුලත් නොවේ.

මානව සම්පත් සංවර්ධනය සඳහා 2007 වර්ෂයේ වූ රු.බි. 161 ක්වූ මුළු ආයෝජනය 2012 වනවිට රු.බි. 235 ක් දක්වා ඉහල ගොස් ඇති අතර, එය 2012 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 3.1 කි. ඊට අමතරව 2007 වර්ෂයේ සමාජ ආරක්ෂණ වියදම වූ රු.බි. 120, 2012 වර්ෂයේදී රු.බි.171 දක්වා ඉහල ගොස් ඇත. සමාජ ආරක්ෂණය සඳහා වූ මුළු වියදමින් සියයට 65 ක් රාජ්‍ය අංශයේ සේවකයින් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම පිණිස වේ. යටිතල පහසුකම් සඳහා 2012 වර්ෂයේ මුළු ආයෝජනය රු.බි. 406 ක් වූ අතර, එය 2007 වර්ෂයේ වූ රු.බි. 159 ට සාපේක්ෂව දෙගුණයකට වඩා වැඩි ආයෝජනයකි.

2.4 2012 - 2014 මධ්‍යකාලීන වියදම් රාමුව තුල 2012 අයවැයෙහි ආංශීය දැක්ම

2012 අයවැය ප්‍රධාන වශයෙන් රජයේ මහින්ද චින්තන සංවර්ධන ප්‍රතිපත්ති රාමුව සහ ඒ තුල හඳුනා ගන්නා ලද උපාය මාර්ග මත පදනම් විය. තවද, එය ශ්‍රී ලංකාව මැදි ආදායම් රටක් බවට පත්කිරීම හා එය එලෙසම පවත්වාගෙන යාම සඳහා වූ රජයේ ප්‍රධාන වගකීම කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරමින් සකස් කර ඇත. ඒ අනුව 2012 අයවැය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් මෙහෙයුම් පසුතල යොදා ගන්නා ලදී.

අ) ආංශීය පදනම - සියළුම අංශ සංවර්ධනය සඳහා අදාල පාර්ශ්වකරුවන් විසින් වසර 3 ක් සඳහා සකස් කරන ලද තුන් අවුරුදු මධ්‍යකාලීන ආංශීය ප්‍රතිපත්ති රාමුවලට අනුකූලව 2012 වර්ෂය සඳහා අයවැය සම්පාදනය කරන ලදී.

ආ) තථ්‍ය ඇගයීම - 2012 අයවැය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150(2) හා 150(3) ව්‍යවස්ථා මගින් ලබාදුන් ප්‍රතිපාදන සීමාවන් යටතේ දරන ලද තථ්‍ය වියදම ඇගයීම මත පදනම් විය.

ඇ) අක්‍රිය ව්‍යාපෘති - වසර ගණනාවක සිට ඇස්තමේන්තුවල දැක්වෙන අක්‍රිය ව්‍යාපෘතීන් යළි විධිමත්ව සැකසීම හෝ ඉවත් කිරීම.

ඈ) ද්විකරණය වීම සහ උපරිපතනය වීම වැලැක්වීම - එක් එක් අමාත්‍යාංශ යටතේ ද්විකරණය හා උපරිපතනය වී ඇති කාර්යයන් නියමිත පරිදි හඳුනා ගැනීමට කටයුතු කරන ලදී. එසේම, සියළුම වියදම් දරන ආයතන හා පලාත් සභාවන් තුළ ආංශීය ප්‍රතිපාදන කළමනාකරණය වන අයුරින් ප්‍රතිපාදන බෙදා හැරීමට උපදෙස් දෙන ලදී.

මෙම ආංශීය ක්‍රියාවලිය පහසු කරලීම සඳහා සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ වියදම් දරන වෙනත් වැය ආයතන, සමාජ ආරක්ෂණය, මානව සම්පත් සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය, මූර්ත ආර්ථිකය, පරිසරය, පර්යේෂණ හා තාක්ෂණය, රාජ්‍ය සේවා සැපයීම, ආරක්ෂාව හා නීතිය බලාත්මක කිරීම යනුවෙන් අංශ 9 යටතේ වර්ගීකරණය කරන ලදී. ඒ අනුව, සියළුම වියදම් දරන ආයතන තමා විසින් සිදුකරන ලද කාර්යයන් මත පදනම් කොට ඉහත අංශවලට වර්ගීකරණය කරන ලදී.

2.5 2012 ආංශීය වියදම් පිළිබඳ විශ්ලේෂණය

2012-2014 මධ්‍යකාලීන අයවැය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම්, ඉහත මෙහෙයුම් පසුතල අනුකූල කර ගනිමින් අංශ 9 ක් යටතේ සකස් කරන ලදී. 2012 වර්ෂයේ පරිදිම ආරම්භයේදී ක්‍රියාත්මක වෙමින් පවතින සංවර්ධන සැලසුම් පිළිබඳ සැබෑ තත්ත්වය සමාලෝචනය කර, අත්‍යාවශ්‍ය ආයෝජන අඛණ්ඩව පවත්වාගෙන යන ලෙස උපදෙස් ලබාදෙන ලදි. එසේම පුනරාවර්තන වියදම් අත්‍යවශ්‍ය දෑ සඳහා පමණක් සීමා කරන ලෙසට ද උපදෙස් දෙන ලදී.

2012 වර්ෂය තුල අංශික පදනම මත ප්‍රතිපාදන වෙන් කිරීමේ ප්‍රමුඛතාවයන් සහ සත්‍ය වියදම අතර සංසන්දනයක් වගු අංක 2.2 මගින් ඉදිරිපත් කර ඇත. එසේම අනපේක්ෂිත වියදම් ආවරණය කිරීම සහ අයවැය යෝජනාවන් ක්‍රියාත්මක කිරීම සඳහා සපයන ලද පරිපූරක ප්‍රතිපාදන ද මෙහි ඇතුලත්ය.

විවිධ සංවර්ධන අංශ අනුව ආංශීය ප්‍රගතිය පහත සඳහන් කර ඇත.

වගුව 2.2

ආංශීය වශයෙන් සම්පත් වෙන් කිරීම හා සැබෑ වියදම - 2012

අංශය	2012 අයවැය (රු.මි.)	මුළු ප්‍රතිපාදනයෙන් ප්‍රතිශතයක් වශයෙන්	2012 සත්‍ය වියදම	මුළු වියදමින් ප්‍රතිශතයක් ලෙස (%)	භාවිතයෙන් ප්‍රතිශතයක් ලෙස (%)
මානව සම්පත් සංවර්ධනය	245,569	19.2	221,273	18.7	90
ප්‍රවාහන	229,950	18.0	218,055	18.5	95
විදුලිය හා බලය	34,402	2.7	32,766	2.8	95
වාරිමාර්ග	42,470	3.3	36,799	3.1	87
ජලසම්පාදන හා සනීපාරක්ෂණ	35,713	2.8	31,342	2.7	88
නිවාස සහ නාගරික සංවර්ධන	5,923	0.5	4,026	0.3	68
ග්‍රාමීය සංවර්ධන	110,355	8.6	91,247	7.7	83
ජාතික ආරක්ෂාව සහ නීතිය බලාත්මක කිරීම	238,424	18.7	237,017	20.1	99
සමාජ ආරක්ෂණය	147,775	11.6	145,918	12.4	99
මූර්ත ආර්ථිකය	64,100	5.0	58,253	4.9	91
ආර්ථික සේවා	98,614	7.7	84,234	7.1	85
තාක්ෂණික සංවර්ධනය	17,214	1.3	15,322	1.3	89
පරිසරය	7,009	0.5	4,182	0.4	60
එකතුව	**1,277,518**	**100.0**	**1,180,434**	**100.0**	**92**

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

** ණය ගෙවීම් හැර*

සටහන : භාණ්ඩාගාරයේ ආංශීය සංවර්ධන සැලැස්මට අනුව

මානව සම්පත් සංවර්ධනය

අධ්‍යාපනය

සාමාන්‍ය අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය සහ වෘත්තීය අධ්‍යාපනය ඇතුලත් සමස්ථ අධ්‍යාපන අංශයේ මධ්‍යම රජයේ සහ පළාත් මගින් සිදුකරනු ලබන මුලු ආයෝජනය 2011 වර්ෂයේදී රු.බි. 111 ක් වූ අතර එය 2012 වර්ෂය වන විට රු.බි. 136 දක්වා ඉහල ගොස් ඇත. අධ්‍යාපනය සඳහා වූ මුළු ආයෝජනයෙන් සමාජ අධ්‍යාපනය සඳහා ආයෝජනය රු.බි. 90 කි. සමස්ථ රටතුල වූ සාමාන්‍ය අධ්‍යාපනයේ ගුණාත්මය ඉහල නැංවීම සහ සමාන ප්‍රවේශය වැඩි කිරීම සඳහා මෙම ආයෝජනය කර ඇත. ගුරුවරුන් පුහුණු කිරීම විෂය මාලා සංවර්ධනය සහ උපකරණ සැපයීම වැනි ක්‍රියාමාර්ග මගින් සාමාන්‍ය අධ්‍යාපනයේ ගුණාත්මය ඉහල නැංවීම සඳහා පියවර ගෙන ඇත. අධ්‍යාපනය සඳහා සමාන ප්‍රවේශය තහවුරු කිරීම උදෙසා ද්විතියික පාසල් 1,000 ක් සහ ප්‍රාථමික පාසල් 5,000 ක් සංවර්ධනය කිරීම 2012 වර්ෂයේදී ආරම්භ කරන ලදි. මෙම වැඩසටහන යටතේ ද්විතියික පාසැල් 409 ක මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර ඉදිකිරීම සඳහා රු.මි. 400 ක් ලබාදී ඇති අතර ප්‍රාථමික පාසල් 1,716 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.මි. 858 ක් ලබාදී ඇත.

උසස් අධ්‍යාපනය සඳහා වියදම 2011 වර්ෂයේදී රු.බි. 19 ක් වූ අතර එය 2012 වර්ෂයේදී රු.බි. 21 ක් දක්වා ඉහළ ගොස් ඇත. 2012 වර්ෂයේ මුලු වියදමින් රු.බි. 1 ක් විශ්ව විද්‍යාල උපාධි අපේක්ෂකයින්ට මහපොල ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යාධාර ලබාදීම සඳහා වැය කරන ලද අතර රු.බි. 69 ක් නව උපාධි අපේක්ෂකයින්ගේ උසස් අධ්‍යාපන කණ්ඩායම් අන්තර් ක්‍රියාකාරිත්වය හුරුකිරීම සහ ඔවුන්ගේ සංවර්ධනය සඳහා වූ සති 02 ක වැඩසටහනක් සඳහා වැය කර ඇත. විශ්ව විද්‍යාලවල ඉදිකිරීම් ව්‍යාපෘති 104 න්, ප්‍රධාන ව්‍යාපෘති 30 ක ඉදිකිරීම් කටයුතු 2012 වර්ෂයේදී අවසන් කරන ලදි. එසේම අයවැය යෝජනාවලට අනුව ශ්‍රී ජයවර්ධනපුර, මොරටුව, යාපනය සහ රුහුණ විශ්ව විද්‍යාල, විශ්ව විද්‍යාල නගර බවට පත්කිරීම සඳහා මූලික සැලසුම් 2012 වර්ෂයේදී සකස් කරන ලදි.

වෘත්තීය අධ්‍යාපනය කෙරෙහි රජය විශේෂ අවධානය යොමුකර ඇති අතර, 2012 වර්ෂයේදී වෘත්තීය පුහුණු සහ නිපුණතා සංවර්ධනය සඳහා රු.බි. 7 ක් වැය කොට ඇත. පුහුණු ශ්‍රමිකයින් සඳහා වූ ඉහල යන ඉල්ලුම සපුරාලීම සඳහා ඉහල ගුණාත්මයකින් යුත් වෘත්තීය පුහුණුවක් ලබාදීම මෙමගින් අපේක්ෂා කෙරේ. තාක්ෂණික ක්ෂේත්‍රය සඳහා විශ්ව විද්‍යාල 25 ක් සංවර්ධනය කිරීමද 2012 වර්ෂයේදී ආරම්භ කරන ලදි. අධ්‍යාපන අංශය සඳහා ඉහත සඳහන් වූ ආයෝජනයන්ට අමතරව වෙනත් අමාත්‍යාංශ මගින්ද අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා රු.බි. 18 ක් වියදම් කර ඇත.

සෞඛ්‍යය

මධ්‍යම රජයේ සහ පළාත් සභා යටතේ බටහිර සහ දේශීය සෞඛ්‍ය දෙඅංශය සඳහා 2012 වර්ෂය තුල කරන ලද මුලු ආයෝජනය රු.බි. 101 ක් පමණ වේ. මෙය 2007 වර්ෂයට සාපේක්ෂව සියයට 43 කින් ඉහළ ගොස් ඇත. 2012 වර්ෂය තුල පුනරාවර්තන වියදම් වලින් විශාල කොටසක් සහ ප්‍රාග්ධන වියදම් වලින් සැලකිය යුතු කොටසක් රෝග නිවාරණය සඳහා වැය කර ඇත. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මුලු ආයෝජනයෙන් සියයට 84 ක් පුනරාවර්තන වියදම් වන අතර සියයට 16 ක් ප්‍රාග්ධන වියදම් වේ. මුළු පුනරාවර්තන වියදම් වලින් සියයට 66 ක් පුද්ගල පඩිනඩි වන අතර සියයට 22 ක් සෞඛ්‍ය සැපයීම් සඳහා වේ. එසේම ත්‍රිපෝෂ ලබාදීම සඳහා රු.බි. 1.3 ක් වැය කර ඇත.

2012 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් ප්‍රධාන වශයෙන් රෝහල් සංවර්ධනය, රෝහල් ප්‍රතිසංස්කරණය සහ උපකරණ ලබාගැනීම සඳහා භාවිතා කර ඇත. 2012 වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන්, සියයට 69 ක් පමණ භාවිතා කිරීමට හැකියාව ලැබී ඇත. රෝහල් සංවර්ධන ව්‍යාපෘති බොහෝ ප්‍රමාණයක පැවති සැලකිය යුතු ප්‍රගතිය දේශීය අරමුදල් භාවිතය ඉහල යාමට හේතුවක් විය. 2012 අයවැය යෝජනාවක් ලෙස රෝහල් 1,000 ක් සංවර්ධනය කිරීම ආරම්භ කිරීම සහ රටපුරාම රෝහල් පද්ධතියේ දිගුකාලීනව පැවති ගිලන් රථ අවශ්‍යතාවය සපුරාලීම සඳහා ගිලන් රථ 250 ක් ලබාදීම ද ප්‍රතිපාදන භාවිතය ඉහලයාමට හේතුවිය. ඊට අමතරව ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති වූ හම්බන්තොට සහ නුවරඑළිය දිස්ත්‍රික් රෝහල් සංවර්ධනය, ජාතික රෝහලේ ලාදුරු ඒකකය සංවර්ධනය කිරීම, කොළඹ දන්ත රෝහල් සංවර්ධනය සහ පොලොන්නරුව මහා රෝහල සංවර්ධනය සඳහා ද විශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්කර ඇත.

දේශීය වෛද්‍ය අංශය සංවර්ධනය සඳහා ලබාදෙන දායකත්වය තවදුරටත් ඉහල නංවමින් 2012 වර්ෂයේදී ඒ සඳහා රු.බි. 2.1 ක් ආයෝජනය කරන ලදි. රෝග නිවාරණ සේවා සඳහා ප්‍රතිපාදන ලබාදීමට අමතරව, 2012 වර්ෂයේදී ආයුර්වේද වෛද්‍ය පද්ධතිය මගින් රෝග වැලැක්වීම වැඩිදියුණු කිරීම සඳහා ද විශාල දායකත්වයක් ලබාදෙන ලදි.

ක්‍රීඩා හා කම්කරු

ක්‍රීඩා ආර්ථික සංකල්පයේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් 2012 වර්ෂයේ ක්‍රීඩා අංශය සඳහා රජය විසින් රු.මි. 1,365 ක් ආයෝජනය කර ඇත. මෙහිදී මානව සම්පත් සංවර්ධනය සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රමුඛතාවය ලබාදී ඇත. ඒ අනුව පළාත් ක්‍රීඩා සංකීර්ණ 8 ක් සහ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීරණ 14 ක් ඉදිකිරීම, කාර්යාල ගොඩනැගිල්ල සහ ටොරින්ටන් කෘතිම ධාවන තීරු ඉදිකිරීම සඳහා පියවර ගෙන ඇත. එසේම 2012 දී පාසල් ක්‍රීඩා සංවර්ධන ව්‍යාපෘති ද සාර්ථකව සිදුකර ඇත.

ග්‍රාමීය ක්‍රීඩා පිටි සංවර්ධන වැඩසටහන යටතේ ග්‍රාමීය ජනතාව සඳහා ජාත්‍යන්තරව පිලිගත් ක්‍රීඩා පහසුකම් සලසා දී ඇත. එසේම මේ සඳහා " ක්‍රීඩා ශක්ති" වැඩසටහන සහ දිස්ත්‍රික් පුහුණු පහසුකම් සංවර්ධන වැඩසටහන් ද 2012 වර්ෂය තුල ක්‍රියාත්මක කර ඇත. ජාතික ශ්‍රමබලකා උපදේශක කවුන්සිලය ශක්තිමත් කිරීම තුලින් ශ්‍රී ලංකාවේ ශ්‍රම ඵලදායිතාවය ඉහල නැංවීම සඳහා රජය විසින් නව ක්‍රමවේදයක් හඳුන්වා දී ඇත. රටේ ශ්‍රම බලකාය සඳහා වඩාත් හොඳ ජීවන මට්ටමක් තහවුරු කිරීම සඳහා ශ්‍රම බලකායේ නිපුණතාවය ඉහල නැංවීම තුලින් ශ්‍රම බලකාය ප්‍රවර්ධනය කිරීම, ඵලදායීතාවය ඉහල නැංවීම ශ්‍රමිකයින්ගේ අයිතිවාසිකම් සහ කම්කරු සබඳතා ආරක්ෂා කිරීම තහවුරු කිරීම වැනි කාර්යයන් සඳහා 2012 වර්ෂයේ රු.මි. 2,300 ක් ආයෝජනය කර ඇත.

ආගම, කලාව හා සංස්කෘතිය

2012 වර්ෂයේදී ආගම, කලාව සහ සංස්කෘතික අංශයේ සමස්ත ආයෝජනය රු.මි. 1,556 කි. ශ්‍රී ලංකාවේ ආගමික, සංස්කෘතික සහ ජාතික උරුමයන්හි ආරක්ෂාව සහ විවිධත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම ආයෝජනය සිදුකර ඇත.

මෙහිදී ආගමික ස්ථාන සංවර්ධනය, දහම් පාසල් වැඩිදියුණු කිරීම, සංස්කෘතික මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම, සහ පුරාවිද්‍යාත්මක ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබාදී ඇත. සංස්කෘතිකමය විවිධත්වය ආරක්ෂා කිරීම සඳහා වූ වැඩසටහන් ප්‍රවර්ධනය සඳහා කටයුතු සිදුකර ඇත. සියලුම ආගම්වලට ආගමික ස්ථාන ප්‍රතිසංස්කරණය සහ ඉදිකිරීම සඳහා රු.මි. 279 ක් වියදම් කර ඇත. එසේම දහම් අධ්‍යාපනය ප්‍රවර්ධනය සඳහා රු.මි. 427 ක් වියදම් කර ඇත. ආගමික ස්ථාන සංවර්ධනය යටතේ රු.මි. 235 ක් වැයකොට 2012 වර්ෂයේදී සංස්කෘතික මධ්‍යස්ථාන 15 ක් ඉදිකිරීම සම්පූර්ණ කර ඇත. පුරාවිද්‍යාත්මක ස්ථාන 10 ක් සංරක්ෂණය කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබාදී ඇති අතර ඒ සඳහා 2012 අයවැය මගින් රු.මි. 216 ක් වෙන්කර ඇත.

යටිතල පහසුකම් සංවර්ධනය

මහා මාර්ග

2012 වර්ෂයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආයෝජනය රු.බි.354.7 ක් විය. ඉන් 1/3 ක් මාර්ග අංශය සංවර්ධනය සඳහා විය. මෙම ආයෝජනයෙන් වැඩි කොටසක් මාර්ග සහ පාලම් නැවත ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය සඳහා භාවිතා කර ඇත. 2011 වර්ෂයේදී මාර්ග සංවර්ධනය සඳහා රු.මි.101.4 ක් වු ආයෝජනය 2012 වර්ෂයේදී රු.බි.216 දක්වා ඉහල ගොස් ඇත.

රජය මගින් අධිවේගී මාර්ග ඉදිකිරීම සහ ප්‍රධාන ජාතික මාර්ග සහ පාලම් වැඩිදියුණු කිරීම සහ ප්‍රතිසංස්කරණය සඳහා විදේශීය අරමුදල් භාවිතා කලද දේශීය අරමුදල් මාර්ග ප්‍රතිසංස්කරණය, වැඩිදියුණු කිරීම සහ පවත්වාගෙන යාම සඳහා භාවිතා කරන ලදි. මීට අමතරව රටේ මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කරන ලදි. මේ අතුරින් මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම යටතේ කි.මි. 572 ක් සම්පූර්ණ කර ඇත. එසේම රට පුරාම ජාතික මාර්ග පද්ධතිය සහ පාලම් සංවර්ධනය සඳහා රු.මි. 5,961 ක් වියදම් කර ඇත. මාර්ග පිලිසකර කිරීමේ වැඩසටහන මගින් කි.මී. 867 ක් වැලි අතුරන ලද අතර කි.මී. 867 ක් ප්‍රතිසංස්කරණ කරන ලදි. 2012 වසර අවසන්වන විට අබලන් හා හානියට පත් පාලම් 45 ක් ප්‍රතිසංස්කරණය කරන ලද අතර 38 ක කටයුතු සිදු කෙරෙමින් පවතී.

මගනැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන මගින් 2012 වර්ෂයේදී ග්‍රාමීය මාර්ග සහ ඒ ආශ්‍රිත බෝක්කු සහ පැතිබැම් ඉදිකිරීම අරමුණු කොට ඇත. මේ යටතේ මාර්ග කි.මී. 635.8 ක් සහ පාලම් 93 ක් ප්‍රතිසංස්කරණය කරන ලදි.

එසේම බෝක්කු 1,112 ක් සහ සපත්තු පාලම් 29 ක් ප්‍රතිසංස්කරණය / ඉදිකිරීම සිදුකරන ලදි. මගනැගුම මගින් 2011 ජුනි මාසයේ ආරම්භ කරන ලද ගම් සම්බන්ධ කිරීමේ වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 12 ක් ආවරණය කරමින් මාර්ග කි.මී. 258 ක් වූ ව්‍යාපෘති 46 ක් ක්‍රියාත්මක කරන ලදි. එසේම දියවර ගම්මාන සහ දැයට කිරුල වැඩසටහන යටතේ ව්‍යාපෘති 35 ක් ක්‍රියාත්මක කරන ලද අතර ඒ යටතේ මාර්ග කි.මී. 197 ක් ප්‍රතිසංස්කරණය කරන ලදි. මග නැගුම යටතේ 2012 වසර සඳහා මුළු ආයෝජනය රු.මි. 3.1 කි.

කොට්ටාව සිට ගාල්ල දක්වා වූ දක්ෂිණ අධිවේගී මාර්ග කොටස 2011 නොවැම්බර් මස ජනතා අයිතියට පැවරීමෙන් පසුව 2012 වර්ෂයේ අත්කර ගන්නා ලද ප්‍රධාන ජයග්‍රහණ අතුරින් එකක් වූයේ දක්ෂිණ අධිවේගී මාර්ගයේ අදියර 11 යටතේ පින්නදූව සිට ගොඩගම දක්වා කි.මී. 30 ක් ඉදිකිරීම සහ ගාලු වරාය සඳහා ප්‍රවේශ මාර්ගය ඉදිකිරීමයි.

බලශක්තිය

සීඝ්‍රයෙන් ඉහල යන බලශක්ති ඉල්ලුම සපුරාලීම සඳහා බාධා විරහිත, කාර්යක්ෂම බලශක්ති සැපයුමක් තහවුරු කරනු වස් රජය මගින් 2012 වර්ෂයේදී රු.බි. 32,207 ක් බලශක්ති අංශය තුල ආයෝජනය කරන ලදි. 2012 වර්ෂයේ සමස්ත ආයෝජනයෙන් රු.මි. 12,482 ක් විදුලිබල උත්පාදනය සඳහා ආයෝජනය කරන ලද අතර ඉන් රු.මි. 8,114 විදුලි බල සම්ප්‍රේෂනය සඳහා ද, රු.මි. 11,408 ක් විදුලි බලය බෙදාහැරීම සඳහා ද ආයෝජනය කර ඇත. 2016 දී සැමට විදුලිය සැපයීමේ ඉලක්කයෙන් සියයට 94 ක් 2012 වසර අවසාන වන විට ලගාකරගත හැකි විය. අදාල වර්ෂය තුල පිවිතුරු බලශක්ති සැපයීම වර්ධනය කිරීම උදෙසා වැඩි අවධානයක් යොමු කොට ඇත.

ප්‍රවාහනය

පොදු ජනතාව සඳහා ආරක්ෂිත සහ කාර්යක්ෂම ප්‍රවාහන සේවයක් 2012 වර්ෂයේදී රජය විසින් ලබාදීම අරමුණු කර ගනිමින් ප්‍රවාහන අංශයේ සංවර්ධන කටයුතු සඳහා රු.බි.48.56 ක් ආයෝජනය කර ඇත. මෙම සමස්ථ ආයෝජනයෙන් රු.මි.38.91 ක් දුම්රිය ප්‍රවාහන අංශය සංවර්ධනය සහ වැඩි දියුණු කිරීම සඳහා ආයෝජනය කර ඇති අතර රු.බිලියන 9.65 ක් පොදු හා පෞද්ගලික බස් ප්‍රවාහන පහසුකම් සංවර්ධනය සඳහා ආයෝජනය කර ඇත.

පොදු පහසුකම්

රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුව මගින් ආරක්ෂිත පිරිසිදු පානීය ජල පහසුකම් හා සනීපාරක්ෂක කටයුතු ඉහල නැංවීම සඳහා ප්‍රමුඛතාවය ලබාදී ඇත. නල ජල සැපයුම 2015 වර්ෂයේදී සියයට 50 දක්වා සහ 2020 වර්ෂය වනවිට සියයට 60 දක්වා ඉහල නැංවීමට සැලසුම් කොට ඇත. වර්ථමානයේදී සියයට 84 ක් වන ආරක්ෂිත පානීය ජල ආවරණය 2020 දී සියයට 100 දක්වා ඉහල නංවනු ඇත. මෙම ඉලක්කය ලගාකර ගැනීම සඳහා 2012 වර්ෂයේදී රු.මි. 39,771 ක් මෙම අංශය සඳහා ආයෝජනය කර ඇත. ඉන් රු.මි. 31,261 ක් එනම් සියයට 80 ක් පමණ මහා පරිමාණ ජල සැපයුම් හා සනීපාරක්ෂක ව්‍යාපෘති සඳහා ආයෝජනය කර ඇත. 2012 වර්ෂයේදී අවසන් කරන ලද ප්‍රධාන ජල සම්පාදන සහ සනීපාරක්ෂක ව්‍යාපෘති ලෙස මීගමුව ජල සම්පාදන ව්‍යාපෘතිය, මහනුවර ජල සම්පාදන යෝජනා ක්‍රමය සහ උතුරු කොළඹ ජල සම්පාදන ව්‍යාපෘතිය දැක්විය හැකිය. මීට අමතරව පලාපත්වල, හිගුරක්ගොඩ, මින්නේරිය, ඉපලෝගම, පහල කඩුගන්නාව, පිටබැද්දර, ඔහිය සහ කන්තලේ නාගරික ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘති ද 2012 වර්ෂයේදී අවසන් කර ඇත.

මහ කොළඹ ජල සම්පාදන සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (මුළු ඇස්තමේන්තුගත මුදල රු.මි. 26,000) 2012 වර්ෂයේදී ආරම්භ කරන ලද එක් ප්‍රධාන ව්‍යාපෘතියකි. එසේම මහියංගනය ජල සම්පාදන ව්‍යාපෘතියද 2012 වර්ෂයේ ආරම්භ කරන ලද තවත් එක් මහා පරිමාණ නාගරික ජල සම්පාදන ව්‍යාපෘතියකි. 2012 වර්ෂයේදී නව ජල සම්බන්ධතා 130,000 ක් මහජනතාව වෙත ලබාදී ඇත.

නිවාස

2012 වර්ෂයේ නිවාස අංශයේ සත්‍ය වියදම රු.මි. 2,442 කි. ඉන් රු.මි. 1,734 ක් වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩසටහන් සඳහා වූ ප්‍රාග්ධන වියදම් වේ. 2012 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩසටහන් වනුයේ, කොළඹ දිස්ත්‍රික්කයේ නිවාස යෝජනා ක්‍රම අලුත්වැඩියා කිරීම, ග්‍රාමීය නිවාස ණය වැඩසටහන, අගුලාන නිවාස ව්‍යාපෘතිය, මොරටුව ලුනාව නාගරික නිවාස යෝජනා ක්‍රමය, ජනසෙවන සහභාගිත්ව පාරිසරික සහ සනීපාරක්ෂක වැඩසටහන වේ. 2012 වර්ෂය අවසන් වනවිට, ඉදිකර ඇති මුලු නිවාස ප්‍රමාණය 35,119 ක් වන අතර පවුල් 32,766 ක් සඳහා විවිධ වැඩසටහන් යටතේ නිවාස ඉදිකර ගැනීම සඳහා ණය පහසුකම් ලබාදී ඇත. මේ යටතේ සමෘද්ධි දිරිය පියස වැඩසටහන යටතේ නිවාස 8,046, විසිරි නිවාස වැඩසටහන යටතේ 8,244 ක්, ජන උපහාර නිවාස වැඩසටහන යටතේ නිවාස 6,294 ක් සහ ගංවතුර ආධාර යටතේ නිවාස 6,007 ක් ඇතුලත් වේ.

තැපැල් හා විදුලි සංදේශ

2012 වර්ෂයේ තැපැල් හා විදුලි සංදේශ අංශය සඳහා රු.බි. 9.08 ක් වෙන්කරන ලද අතර එය 2011 ට සාපේක්ෂව සියයට 11.4 ක වැඩිවීමකි. මෙම අරමුදල් ප්‍රධාන වශයෙන් දිවයින පුරා තැපැල් සේවය සංවර්ධනය කිරීම සඳහා භාවිතා කරන ලදි. තැපැල් සේවාව සඳහා වන වියදම අවම කිරීම සහ ගුණාත්මක සේවාවක් ලබාදීම තහවුරු කිරීම උදෙසා දිවයින පුරා ඇති තැපැල් කාර්යාල අතර සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම සඳහා "තැපැල් කාර්යාල ජාලගත කිරීමේ ව්‍යාපෘතිය" නොකඩවා ක්‍රියාත්මක කරන ලදි. එසේම විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය මගින් තොරතුරු තාක්ෂණයට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත. උදා :- දිවයින පුරා පාසල් පරිගණක විද්‍යාගාර ඉදිකිරීම, මෙමගින් ශ්‍රී ලංකාව තුල තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය 2016 වන විට සියයට 75 දක්වා ඉහල නැංවීමට අදහස් කෙරේ.

ග්‍රාමීය හා ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධනය

අමාත්‍යාංශ කිහිපයක් යටතේ ග්‍රාමීය සහ ප්‍රාදේශීය සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරනු ලැබේ. 2012 වර්ෂයේ මේ සඳහා වූ සමස්ථ ආයෝජනය රු.බිලියන 43.7 කි. මින් රු.බි. 27.8 ක් ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධනය සඳහාය. ග්‍රාමීය මාර්ග, ජල සම්පාදන සහ සනීපාරක්ෂාව, සුලු වාරිමාර්ග සංවර්ධනය, විදුලිය ලබාදීම, නිවාස සහ අනෙකුත් ජීවනෝපාය සංවර්ධන කටයුතු වැනි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ.

ගම්වල ප්‍රධාන සංවර්ධන කටයුතු සහ ග්‍රාමීය කේන්ද්‍රික සංවර්ධන කටයුතු අතර කාර්යක්ෂම සම්බන්ධතාවක් ප්‍රවර්ධනය කිරීම "ගමනැගුම" ජාතික වැඩසටහන මගින් ඉලක්ක කර ඇත. ප්‍රධාන වශයෙන් ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් 2012 වර්ෂයේදී මෙම වැඩසටහන යටතේ රු.බි. 12.9 ක් ආයෝජනය කර ඇත. ජීවනෝපාය සංවර්ධන කටයුතු, විශේෂයෙන් ගෙවතු වගා වැඩසටහන අරමුනු කරගනිමින් " දිවිනැගුම" ව්‍යාපෘතිය යටතේ ගෘහ ආර්ථික ඒකක මිලියන 1.5 ක් පිහිටුවන ලදි.

මීට අමතරව, ප්‍රාදේශීය සංවර්ධන ඉලක්කවල කොටසක් ලෙස ජාතික ඒකාබද්ධතාවය තහවුරු කිරීම සඳහා ගැටුම් ඇතිවූ ප්‍රදේශවල බිම්බෝම්බ ඉවත් කිරීමේ කටයුතු සඳහා රු.මිලියන 4 ක් වැය කර ඇත. මෙම කටයුතු අවතැන්වූවන් සඳහා නිවාස සැපයීම මගින් නැවත පදිංචි කිරීම සහ ඔවුන්ගේ ජීවන මට්ටම ඉහල නැංවීම සඳහා උපකාරී විය.

ජාතික ආරක්ෂාව

2012 වර්ෂය සඳහා ජාතික ආරක්ෂාව වෙනුවෙන් වූ සමස්ත වියදම රු.බිලියන 233 කි. ඉන් රු.බි. 219 ක් පුනරාවර්තන වියදම් සඳහා වූ අතර ඉතිරි රු.බි. 14 ප්‍රාග්ධන වියදම් සඳහා විය. මුලු වියදමින් රු.බි. 217 ක් ශ්‍රී ලංකා පොලිසිය සහ ත්‍රිවිධ හමුදාව සඳහා වූ අතර රු.බි. 16 ක් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, විශේෂ කාර්ය සාධන බලකාය, ජාතික ශීඝ්‍රහට බලකාය, රජ්‍ය බුද්ධි සේවාව සහ රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ පරිපාලන වියදම් සඳහා වේ. ශ්‍රී ලංකා පොලිසියේ සහ ආරක්ෂක හමුදාවල පුද්ගල පඩිනඩි සඳහා වියදම රු.බිලියන 182 ක් එනම් ජාතික ආරක්ෂාව සඳහා වූ මුළු පුනරාවර්තන වියදමින් සියයට 78 ක් ලෙස වාර්තා වේ. ඉතිරි වියදම වූ රු.බිලියන 51 හෝ සියයට 12 ආහාරපාන නිල ඇඳුම්, ඉන්ධන හා අනෙකුත් මෙහෙයුම් වියදම් සඳහා විය. ප්‍රාග්ධන වියදම වූ රු.බිලියන 14, නව යන්ත්‍ර සහ උපකරණ මිලදී ගැනීම පවතින යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීම සහ ගැටුම් පැවති කාලසීමාව තුල නොසලකා හරින ලද අනෙකුත් මූලික යටිතල පහසුකම් සංවර්ධනය සඳහා විය.

නීතිය බලාත්මක කිරීම

2012 වර්ෂයේදී යුක්තිය හා නීතිය බලාත්මක කිරීම යන අංශය තුල ඵලදායී පරිපාලනයක් තහවුරු කිරීම සඳහා වන සමස්ත වියදම රු.බිලියන 9,068 කි. එකී සමස්ත වියදමින් රු.මිලියන 642 ක් මීගමුව, කොටපොල සහ කඩවත නව උසාවි සංකීර්ණ ඉදිකිරීම, පදවිය, මනම්පිටිය සහ බකමූණ සංචාරක මහේස්ත්‍රාත් අධිකරණ ඉදිකිරීම්, පොතුවිල් සහ හිගුරක්ගොඩ මහේස්ත්‍රාත් අධිකරණය ඉදිකිරීම සහ මඩකලපුව දිස්ත්‍රික්කයේ ළමයින් සඳහා වෙනමම අධිකරණ පද්ධතියක් ඉදිකිරීමේ කටයුතු අවසන් කිරීම,කුච්චවේලි, කල්පිටිය සහ ක්වයිසි සංචාරක මහේස්ත්‍රාත් අධිකරණය, අක්කරපත්තුව දිස්ත්‍රික් අධිකරණය, සම්මන්තුරේ මහේස්ත්‍රාත් අධිකරණය ඉදිකිරීම ආරම්භ කිරීම සඳහාත් භාවිතා කරන ලදි. මෙම අධිකරණ සඳහා කාර්යාල ගොඩනැගිලි, ලේඛනාගාර, ගබඩා ආදිය සැපයීමට අපේක්ෂිතය. එසේම අධිකරණ පද්ධතියේ නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන සහ වැඩිදියුණු කිරීමේ අරමුණින් නිලධාරීන් 372 ක් සඳහා දේශීය පුහුණුව සහ නිලධාරීන් 58 දෙනෙකු සඳහා විදේශීය පුහුණුව ලබාදීම සඳහා රු.මිලියන 66 ක් වැයකර ඇත.

උතුරු සහ නැගෙනහිර පළාත තුල සාමය ස්ථාපිත කිරීමෙන් පසු එම ප්‍රදේශවල අධිකරණ පද්ධතිය තුල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා විශේෂ අවධානයක් යොමු කරමින්, අධිකරණ සංකීර්ණ කිහිපයක් නැවත ඉදිකිරීම සහ නවීකරණය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන CARE ව්‍යාපෘතිය යටතේ සිදුකර ඇත.

මීට අමතරව බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ නොමඟ ගිය වරදකරුවන් පුනරුත්ථාපනය කිරීම සහ බන්ධනාගාර ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ බන්ධනාගාර ඉදිකිරීම සඳහා රු.මි. 435 ක් වැය කර ඇත.

සමාජ ආරක්ෂණය

2012 වර්ෂයේදී සමාජ ආරක්ෂණය සහ සුභසාධන කටයුතු සඳහා දළ වශයෙන් රු.බිලියන 172 ක් පමණ ආයෝජනය කර ඇත. මේ යටතේ සමාජ ආරක්ෂණය, සමාජ ආරක්ෂණ ජාලයන් සහ සමාජ සේවා කටයුතු අයත්වේ. අඩු ආදායම්ලාභී පවුල්, වැඩිහිටියන්, ආබාධිතයන්, අනාථ කාන්තාවන් සහ ළමුන් සඳහා සුභසාධනය සහ ආරක්ෂාව ලබාදීම අරමුණු කරමින් විවිධ රේඛීය අමාත්‍යාංශ සහ පළාත් සභා මගින් විවිධ ව්‍යාපෘති සහ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. සමාජ ආරක්ෂණය සඳහා වූ මුළු ආයෝජනයෙන් රු.මිලියන 12,281 ක් සමෘද්ධි සහනාධාර, ආපදා සහනාධාර, ආබාධිතයන් සඳහා සහනාධාර, වැඩිහිටි සහනාධාර සහ අවතැන්වූවන් සඳහා සහනාධාර වශයෙන් වැයකර ඇත.

මූර්ත ආර්ථිකය

කෘෂිකර්ම අංශය

කෘෂිකාර්මික අංශය ප්‍රධාන වශයෙන් ආහාර බෝග, වැවිලි බෝග, පශු සම්පත්, ධීවර හා ජලජ සම්පත්, වාරිමාර්ග ඉඩම් හා ඉඩම් සංවර්ධන යන උප අංශ වලින් සමන්විත වේ. 2012 වර්ෂයේදී කෘෂිකර්ම අංශය සඳහා සමස්ත ආයෝජනය රු.මිලියන 104,456 ක් විය. එය 2012 සමස්ත ආයෝජනයට සාපේක්ෂව සියයට 23 ක වැඩිවීමකි. කෘෂිකර්ම අංශයේ ඵලදායිතාවය හා තරගකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා කුඩා පරිමාණ ගොවීන්ට පුළුල් පරාසයක දිරිදීම් සැපයීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය තහවුරු කරමින් 2012 වර්ෂය සඳහා කෘෂිකර්ම අංශයේ ආයෝජනයෙන් රු.මිලියන 48,248 ක් පොහොර සහනාධාර සඳහා වැය කර ඇත.

2012 වර්ෂයේ කෘෂිකර්ම අංශය සඳහා වූ රාජ්‍ය ආයෝජනය දේශීය ආහාර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම, රජයේ බීජ ගොවිපලවල් සංවර්ධනය, සහතික කළ බීජ නිෂ්පාදනය, කෘෂි පර්යේෂණ කටයුතු සහ වැවිලි කර්මාන්තය සංවර්ධනය සඳහා යොමුකර ඇත. එසේම ඉඩම් වල අයිතිය ලබාදීම තහවුරු කරමින් බිම්සවිය වැඩසටහන 2012 වර්ෂයේදී අඛණ්ඩව ක්‍රියාත්මක කර ඇත.
කෘෂිකර්ම අංශයේ උප අංශ සඳහා 2012 වර්ෂයේ රාජ්‍ය වියදම් පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.

වී සහ අනෙකුත් ආහාර බෝග

ආහාර බෝග ප්‍රවර්ධනය සඳහා 2012 වර්ෂයේ සිදුකරන ලද වියදම රු.මිලියන 61,228 කි. එකී සමස්ත වියදමින් වැඩි ප්‍රමාණයක් පොහොර සහනාධාරය සඳහා වැය කොට ඇත. ඊට අමතරව බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය, පර්යේෂණ හා ව්‍යාප්ති සේවාව ප්‍රවර්ධනය කිරීම, සහනදායී මිලට කෘෂිකර්ම යෙදවුම් සැපයීම හා ඉඩම් සංවර්ධනය සඳහා ප්‍රමුඛතාවය ලබාදී ඇත. මෙම ආයෝජනයන්හි ප්‍රතිඵලයක් ලෙස, ආහාර භෝග නිෂ්පාදනය 2012 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 680,895 ක් වූ අතර එය 2011 වර්ෂයේ ආහාර භෝග නිෂ්පාදනය වූ මෙට්‍රික් ටොන් 506,334 සමඟ සංසන්දනයේදී සියයට 34 ක වැඩිවීමකි. එසේම 2012 වර්ෂයේ බඩඉරිඟු නිෂ්පාදනය ස්වයංපෝෂිත මට්ටමට ලඟා වූ අතර ආනයනය කරන ලද ප්‍රමාණය මෙට්‍රික් ටොන් 1,004 දක්වා අඩුවිය.

වාරිමාර්ග

2012 වර්ෂයේ වාරිමාර්ග අංශයේ සංවර්ධනය සහ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා රු.බිලියන 30.7 ක් වෙන්කර ඇත. මෙම අංශය සඳහා කරන ලද ආයෝජනය රටතුල වී සහ අනෙකුත් බෝග නිෂ්පාදනය, පශු සම්පත් සංවර්ධනය සඳහා දායක වී ඇත. එසේ වුවද දැදුරු ඔය සහ රඹුක්කන්ඔය ව්‍යාපෘතිය සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කර තිබුණද එම ව්‍යාපෘතිවල වැඩ අවසන් වූයේ පිලිවෙලින් සියයට 66 ක් සහ සියයට 80 ක් පමණි. එසේම උමා ඔය සහ මොරගහකන්ද නව ජලාශ ඉදිකිරීම සඳහා ද මෙම වර්ෂයේ ආයෝජන භාවිතා කරන ලදි.

පශු සම්පත්

2012 වර්ෂයේ පශු සම්පත් අංශය සඳහා වියදම රු.මිලියන 2,544 කි. එය 2011 වර්ෂයේ වියදම සමඟ සන්සන්දනයේදී සියයට 38 ක වැඩිවීමකි. මෙම ආයෝජන කිරි ගවයින් ආනයනය, දියර කිරි භාවිතය ප්‍රවර්ධනය කිරීම, කිරි ගම්මාන වැඩසටහන, සත්ත්ව අභිජනනය සහ සෞඛ්‍ය වැඩිදියුණු කිරීම සහ ග්‍රාමීය සහ පසුගාමී ප්‍රදේශවල මූලික පහසුකම් සංවර්ධනය සඳහා යොමු කොට ඇත.

මීට අමතරව ගොවීන් සඳහා නැවුම් කිරි ලීටරයක මිල රු.50 දක්වා ඉහළ නැංවීම සඳහා මිල්කෝ ආයතනයට රු.මිලියන 160 ක් ලබාදීමද මේ වසරේ සිදුකර ඇත. දේශීය කිරි නිෂ්පාදනය 2011 වර්ෂයේ ලීටර් මිලියන 258.3 ක් වූ අතර එය 2012 වර්ෂයේදී ලීටර් මිලියන 299 දක්වා සියයට 16 කින් ඉහළ ගොස් ඇත.

ධීවර

ධීවර හා ජලජ සම්පත් සංවර්ධනය සඳහා 2012 වර්ෂයේ සමස්ත රාජ්‍ය වියදම රු.මිලියන 2,986 කි. එය 2011 වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 12 ක වැඩිවීමකි. 2012 වර්ෂයේ මුළු වියදමින් රු.මිලියන 1,019 පුනරාවර්තන වියදම් සඳහා වූ අතර රු.මිලියන 1,967 ක් ප්‍රාග්ධන වියදම් සඳහා වේ. 2012 වර්ෂයේ දී ධීවර අංශයේ යටිතල පහසුකම් සමඟ ධීවර ප්‍රජාවගේ ජීවනෝපාය සංවර්ධන කටයුතු සඳහා ප්‍රමුඛතාවය ලබාදී ඇති අතර එමගින් ධීවර ප්‍රජාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම සහ මිරිදිය සහ කරදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ. 2012 වර්ෂයේදී මුළු මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 486,170 ක් වූ අතර එය 2011 වර්ෂයේ මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 41,340 කින් ඉහළ යාමකි.

කර්මාන්ත

කර්මාන්ත අංශයේ සංවර්ධනය සඳහා 2012 වර්ෂයේ රාජ්‍ය වියදම රු.මිලියන 1,149 කි. මෙම ආයෝජන මන්නාරම, මතුගම සහ ත්‍රිකුණාමලය කර්මාන්තපුරවල යටිතල පහසුකම් සංවර්ධනය, අත්යන්ත්‍ර ඇගළුම් ගම්මාන පිහිටුවීම, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සහ ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන් සහ ව්‍යවසාය සංවර්ධන වැඩසටහන් සඳහා යොමුකර ඇත.

සේවා

සංචාරක, වෙළඳ සහ සමුපකාර යන අංශවලින් සේවා අංශය සමන්විත වේ. මෙම අංශ සඳහා 2012 වර්ෂයේ රාජ්‍ය ආයෝජනය රු.මිලියන 1.6 කි. පාරිභෝගික ආරක්ෂණය තහවුරු කරන අතරම ආහාර බෙදාහැරීම ශක්තිමත් කිරීම සඳහා ලක් සතොස වෙළඳපල 20 ක් පිහිටුවීම 2012 වර්ෂයේදී සිදුකරන ලදි. එසේම ආර්ථික මධ්‍යස්ථාන ප්‍රතිසංස්කරණය සඳහා ද අවශ්‍ය ප්‍රතිපාදන සලසා දෙන ලදි.

විද්‍යා,තාක්ෂණ පර්යේෂණ සහ සංවර්ධනය

කර්මාන්ත, කෘෂිකර්ම, වාරිමාර්ග, සෞඛ්‍ය, තොරතුරු හා තාක්ෂණය, ජල සම්පත් ආදී අංශ ආවරණය කරමින් තාක්ෂණ හා පර්යේෂණ ක්ෂේත්‍ර සඳහා වූ මෙම අංශය වෙනුවෙන් 2012 වර්ෂයේ ආයෝජනය රු.බිලියන 10 කි. 2012 වර්ෂයේදී ජාතික නැනෝ තාක්ෂණ වැඩසටහන, බහුවිධ ග්‍රාමීය ප්‍රමිතිකරණ වැඩසටහන සහ කෘෂි ආහාර ව්‍යාපෘති ආදී වැඩසටහන් අඛණ්ඩව සිදුකරන ලදි. ජාතික ආර්ථිකයේ සංවර්ධන ප්‍රමුඛතාවයන්ට අදාල සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය, විද්‍යාව ප්‍රචලිත කිරීම, මූලික සහ උසස් තාක්ෂණ ක්‍රම හුවමාරු කිරීම ආදිය කෙරෙහි අවධානයන් යොමු කරමින් තාක්ෂණ සහ පර්යේෂණ අධ්‍යයන අංශය යටතේ ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතන ශක්තිමත් කිරීම සඳහා රු.මිලියන 1,225 ක් වැය කර ඇත.

රාජ්‍ය සේවා සැපයීම

යහ පාලනය සහ මහජනතාව කේන්ද්‍ර කරගත් සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා අවස්ථා සලසමින් ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ රාජ්‍ය සේවා සැපයීම පරිපාලනය සහ නියාමනය සඳහා ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර ඇත. 2012 වර්ෂයේදී මෙම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා රු.බිලියන 260 ක් අයෝජනය කර ඇත. පුනරාවර්ථන වියදම එනම් පුද්ගල පඩිනඩි සහ සේවා සැපයීම සඳහා වූ සහාය සේවා සඳහා වූ වියදම රු.බිලියන 232 ක් ලෙස වාර්තා වී ඇත. රාජ්‍ය සේවකයින් සඳහා විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික සඳහා වියදම රු.බිලියන 127 කි. රාජ්‍ය ආයෝජනයෙන් රු.බිලියන 28 ක් ප්‍රාග්ධන වියදම් සඳහා වැයවී ඇත. එමගින් දුෂ්කර ප්‍රදේශවල රාජ්‍ය සේවකයින් සඳහා නිල නිවාස ඉදිකිරීම, තොරතුරු තාක්ෂණ සංවර්ධනය, රාජ්‍ය සේවා කාර්යක්ෂම කිරීම සඳහා ප්‍රාදේශීය මට්ටමේ සියලුම කාර්යාල ජාලගත කිරීම, පළාත් පාසැල් හා රෝහල්වල යටිතල පහසුකම් සංවර්ධනය, ග්‍රාමීය ප්‍රදේශ සඳහා විදුලිය සැපයීම, ග්‍රාමීය හා පළාත් මාර්ග සංවර්ධනය සහ පවත්වාගෙන යාම, ජීවනෝපාය සංවර්ධනය සහ කුඩා නාගරික ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන් ආදිය සඳහා පහසුකම් සලසා දෙන ලදි.

පරිසරය

2012 වර්ෂයේ පරිසර අංශය සඳහා මුළු ආයෝජනය රු.මිලියන 2,379 කි. පරිසර අංශය සඳහා වූ ආයෝජනය පරිසර සංරක්ෂණය, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා පරිසර දූෂණය වැලැක්වීම ආදී ප්‍රතිපත්ති ක්ෂේත්‍ර තුනක් යටතේ සිදුකර ඇත. මේ අනුව පරිසර සංරක්ෂණය සඳහා රු.මිලියන 526 ක් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා රු.මි. 354 ක් සහ පරිසර දූෂණය වැලැක්වීම සඳහා රු.මිලියන 136 ක් වැයකොට ඇත.

2012 වසර සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදවලින් සියයට 93 ක් භාවිතයට ගෙන ඇත. පර්යේෂණ හා තාක්ෂණ අංශය හැරුණු විට අනෙක් සෑම අංශයක්ම ඒවායේ මුළු ප්‍රතිපාදන වලින් සියයට 70 කට වැඩි ප්‍රමාණයක් භාවිතා කර ඇත. මුළු ප්‍රතිපාදනවලින් සියයට 31 ක් ඉහළ ම ප්‍රමුඛතාවය වූ ජාතික, පළාත් හා ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති හා අදාළ යටිතල පහසුකම් ක්ෂේත්‍රයට ලබාදී ඇත.

විවිධ සංවර්ධන අංශ සඳහා වූ විශේෂිත කාර්ය සාධනයන් පහත දක්වා ඇත.

වගුව 2.3

ආංශීය වශයෙන් මූලධන හා පුනරාවර්තන වියදම් 2012

රු.මිලියන

අංශය	2012 ඇස්තමේන්තුව			2012 සත්‍ය					%
	පුනරාවර්ථන	මූලධන	එකතුව	පුනරාවර්ථන	%	මූලධන	%	එකතුව	%
මානව සම්පත්	190,385	55,184	245,569	185,334	97	35,939	65	221,273	90
ප්‍රවාහන	17,037	212,913	229,950	16,353	96	201,702	95	218,055	95
විදුලිය හා බලශක්ති	1,175	33,227	34,402	553	47	32,213	97	32,766	95
වාරිමාර්ග	6,670	35,800	42,470	6,559	98	30,240	84	36,799	87
ජල සහ සනීපාරක්ෂණ	172	35,541	35,713	169	98	31,173	88	31,342	88
නිවාස සහ නාගරික සංවර්ධන	750	5,173	5,923	708	94	3,318	64	4,026	68
ග්‍රාමීය සංවර්ධනය	10,441	99,914	110,355	10,357	99	80,890	81	91,247	83
ජාතික ආරක්ෂාව හා නීතිය බලාත්මක කිරීම	222,764	15,660	238,424	221,715	100	15,302	98	237,017	99
සමාජ ආරක්ෂණය	145,213	2,562	147,775	144,281	99	1,637	64	145,918	99
මූර්ත ආර්ථිකය	46,957	17,143	64,100	46,258	99	11,995	70	58,253	91
සේවා ආර්ථිකය	67,384	31,230	98,614	62,966	93	21,268	68	84,234	85
තාක්ෂණික සංවර්ධනය	12,378	4,836	17,214	12,143	98	3,179	66	15,322	89
පරිසරය	2,036	4,973	7,009	1,948	96	2,234	45	4,182	60
එකතුව	**723,362**	**554,156**	**1,277,518**	**709,344**	**98**	**471,090**	**85**	**1,180,434**	**92**

* රාජ්‍ය ණය ගෙවීම් හැර

සටහන - භාණ්ඩාගාර ආකෘතියට අනුව සංවර්ධිත අංශ

මූලාශ්‍ර - ජාතික අයවැය දෙපාර්තමේන්තුව

2.6 සුභ සාධන වියදම් සහ සංවර්ධන සහනාධාර සඳහා රාජ්‍ය වියදම

සමතුලිත සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීමේ ප්‍රයත්නයට සමගාමීව සමාජයේ අවදානම් තත්වයන්ට පහසුවෙන් ගොදුරුවන සමාජ කණ්ඩායම්වල ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් සුභසාධන හා සංවර්ධන සහනාධාර ලබාදීම අඛණ්ඩව සිදුකල යුතු බව රජය විසින් අවධාරණය කර තිබේ. ඒ අනුව 2012 වර්ෂයේදී සමස්ථ සහනාධාර වෙනුවෙන් දල වශයෙන් රු.බිලියන 205 ක් දරා ඇත. එය 2012 වර්ෂයේ මුළු වියදමින් ආසන්න වශයෙන් 1/5 කි. 2012 වර්ෂයේ සුබසාධන සහ සංවර්ධන සහනාධාර ගෙවීම් ලබාදුන් ආකාරය 2.4 වගුවේ විස්තරාත්මකව දක්වා ඇත.

2.4 වගුව

සුබසාධන ගෙවීම් හා සංවර්ධන සහනාධාර වියදම් 2012

ක්ෂේත්‍රය	2012		වියදම් කළ අනුපාතය	සමස්ත සුබසාධන වියදම් හා සංවර්ධන සහනාධාරයේ % ලෙස (සත්‍ය)	ආංශයීය දායකත්වය % ලෙස (සත්‍ය)
	ප්‍රතිපාදන රු.මිලි.	සත්‍ය වියදම රු.මිලි.			
සුබසාධන ගෙවීම්					
සෞඛ්‍ය හා පෝෂණය	**19,115**	**18,439**	**96,46**	**9.01**	**10.97**
ළමුන් සඳහා දියර කිරි	240	205	85.42	0.10	0.12
රජයේ රෝහල් සඳහා වෛද්‍ය සැපයීම්	17,000	16,796	98.80	8.21	10.00
ත්‍රිපෝෂ වැඩසටහන	1,575	1,189	75.49	0.58	0.71
පෝෂණ මල්ල	300	249	83.00	0.12	0.15
අධ්‍යාපනය	**7,775**	**7,110**	**91.45**	**3.47**	**4.23**
පාසල් පෙළ පොත්	2,400	2,055	85.63	1.00	1.22
පාසල් නිල ඇඳුම්	230	230	100.00	0.11	0.14
පාසල් වාර ප්‍රවේශපත්‍ර	1,233	1,233	100.00	0.60	0.73
ආබාධිත සිසුන් සඳහා	18	17	94.44	0.01	0.01
ශිෂ්‍යත්ව	230	230	100.00	0.11	0.14
පාසල් පෝෂණ ආහාර වැඩසටහන	2,792	2,790	99.93	1.36	1.66
දහම් පාසල් ගුරුවරුන් සඳහා පුස්තකාල දීමනාව	391	233	59.59	0.11	0.14
වෘත්තීය / කාර්මික පුහුණු වැටුප්	463	305	65.87	0.15	0.18
ශිෂ්‍යාධාර හා වාර ප්‍රවේශපත්‍ර	18	17	94.44	0.01	0.01
සමාජ සුබසාධනය	**138,913**	**140,248**	**100.96**	**68.53**	**83.47**
සමෘද්ධි හා භූමිතෙල් සහනාධාර	10,600	10,553	99.56	5.16	6.28
ආබාධිත සෙබළුන්ට ආධාර	13,700	14,779	107.88	7.22	8.80
අභ්‍යන්තර අවතැන්වූවන් සඳහා ආධාර	54	54	100.00	0.03	0.03
ලෝක ආහාර වැඩසටහන යටතේ ආධාර	2,590	2,447	94.48	1.20	1.46
ගංවතුර හා නියං ආධාර	170	153	90.00	0.07	0.09
පුද්ගලයින් පුනරුත්ථාපනය	112	108	96.43	0.05	0.06
ආබාධිත පුද්ගලයින් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය	404	403	99.75	0.20	0.24
සෙනෙහස වැඩසටහන (පෝෂණ මංපෙත)	20	13	65.00	0.01	0.01
වැඩිහිටියන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය	63	56	88.89	0.03	0.03
විශ්‍රාම වැටුප්	111,200	111,682	100.43	54.57	66.47

ක්ෂේත්‍රය	2012		වියදම් කළ අනුපාතය	සමස්ත සුබසාධන වියදම් හා සංවර්ධන සහනාධාරයේ % ලෙස (සත්‍ය)	ආංශයීය දායකත්වය % ලෙස (සත්‍ය)
	ප්‍රතිපාදන රු.මිලි.	සත්‍ය වියදම රු.මිලි.			
වෙනත්	**2,819**		79.21	**1.09**	**1.33**
ආගමික ස්ථාන හා පාසල් සඳහා ජල සහනාධාරය	49	49	100.00	0.02	0.03
වීදි ආලෝකකරණය	586	-	-	-	-
ලාභදායී නොවන මාර්ග සඳහා ශ්‍රී.ලං.ග.ම.ට ආධාර	2,184	2,184	100.00	1.07	1.30
සුබසාධන ගෙවීම්වල එකතුව	**168,622**	**168,030**	**99.65**	**82.10**	**100.00**
සංවර්ධන සහනාධාර					
කෘෂිකර්මාන්තය සඳහා ආධාර	**37,343**	**36,628**	**98.09**	**17.90**	**100.00**
පොහොර සහනාධාරය	37,000	36,456	98.53	16.44	67.79
කෘෂිකාර්මික ණය යනාදිය සඳහා පොලී සහනාධාර	343	172	50.15	0.08	0.32
මෙහෙයුම් පාඩු	-	-	-	-	-
ශ්‍රී ලංකා දුම්රිය	4,516	3,797	84.08	1.71	7.06
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය	-	9,972	-	4.50	18.54
තැපැල් දෙපාර්තමේන්තුව	3,171	3,381	106.62	1.52	6.29
සංවර්ධන සහනාධාර මුළු එකතුව	**37,343**	**36,628**	**98.09**	**17.90**	**100.00**
සුබසාධන ගෙවීම් හා සංවර්ධන සහනාධාරවල මුළු එකතුව	**205,965**	**204,658**	**99.37**	**100.00**	

මූලය - ජාතික අයවැය දෙපාර්තමේන්තුව

2.7 2012 අයවැය කළමනාකරණය

2.7.1 රාජ්‍ය ගිණුම්වලට අනුව ආදායම හා වියදම

2012 වර්ෂයේ රජයේ වියදම රුපියල් බිලියන 1,575 ක් වූ අතර, එය පෙර වසර හා සසඳන කල සියයට 8.8 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. 2012 වසරේ පුනරාවර්තන වියදම රුපියල් බිලියන 1,131 ක් වූ අතර, එය 2011 වසරට සාපේක්ෂව සියයට 10.3 ක වැඩිවීමක් නිරූපණය කරයි. මෙම අගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත්විට සියයට 14.9 කි. එය 2011 වසරේදී සියයට 15.7 ක් විය. ණය සඳහා පොලී ගෙවීමට රුපියල් බිලියන 408 ක් වැයවූ අතර, එය මුළු පුනරාවර්තන වියදම්වලින් සියයට 36 කි. මෙම අගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සැලකූ කල සියයට 5.4 ක් වන අතර, එය පසුගිය වසරේදී වාර්තා වූ අගයට ආසන්න වශයෙන් සමාන වේ. පොලී ගෙවීම් නොවන රජයේ වියදම් ප්‍රමාණය රුපියල් බිලියන 1,167 කි. එය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත්කල එය 2011 වසරේදී සියයට 16.7 සිට 2012 වසරේ සියයට 15.4 දක්වා අඩුවීමක් පෙන්නුම් කරයි. 2012 වසරේදී ප්‍රාග්ධන ආයෝජන රුපියල් බිලියන 444 ක්වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව සියයට 5.1 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. මෙම අගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 5.9 කි. ප්‍රාග්ධන ආයෝජනවලින් වැඩි ප්‍රතිශතයක් භෞතික යටිතල පහසුකම් සංවර්ධනය සඳහා යොදවා ඇති අතර, එම ප්‍රමාණය 2011 වසරේදී රුපියල් බිලියන 213 ක් වූ අතර, 2012 දී රුපියල් බිලියන 267 දක්වා වැඩිවිය.

රාජ්‍ය වියදම් සංයුතිය

වගුව 2.5: රාජ්‍ය වියදම් සංයුතිය දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස

අංශය	2005-2007	2008-2010	2011-2013	2014-2016 (ඇස්තමේන්තුගත)
මුළු වියදම	24.2	23.7	21.2	20.8
පුනරාවර්තන	18.0	17.3	15.1	14.5
මූලධන	6.2	6.4	6.1	6.3

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

ප්‍රස්ථාරය 2.1: රාජ්‍ය වියදම් සංයුතිය 2012 වර්ෂය



මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

වැටුප් හා වේතන

2012 වර්ෂයේ ආරක්ෂක සේවාවන් සහ ප්‍රාදේශීය සභාවන් ඇතුලත්ව රාජ්‍ය නිලධාරීන් සඳහා වූ වැටුප් හා වේතන සියයට 8.8 කින් ඉහළ ගිය අතර එය මුළු වියදමින් රු.බිලියන 348 කි. මෙය 2011 වර්ෂය හා සැසඳීමේදී සියයට 6.3 ක වැඩිවීමකි. එය මුළු පුනරාවර්ථන වියදමින් 30.7% ක දායක වීමකි. රාජ්‍ය සේවකයන් සඳහා සියයට 10 ක විශේෂ දීමනාවක් ඔවුන්ගේ මූලික වැටුප පදනම් කරගෙන මාණ්ඩලික නොවන නිලධාරීන් සඳහා 2012 ජනවාරි සිට ද මාණ්ඩලික නිලධාරීන් සඳහා 2012 ජූලි මස සිට ද ක්‍රියාත්මක වන පරිදි වැටුප් වැඩිවීම පහත පරිදි සිදු කරන ලදි.

වගුව 2.6: ජාතික සහ ප්‍රාදේශීය රාජ්‍ය සේවාවන්හි වැටුප් වියදමේ ව්‍යාප්තිය

රු.මිලියන

අංශය	ජාතික	ප්‍රාදේශීය	එකතුව
අධ්‍යාපන	15,812	52,489	68,301
සෞඛ්‍ය	32,104	20,952	53,056
සිවිල් පරිපාලන	31,237	10,343	41,575
ආර්ථික සහ සමාජසේවා	16,817	4,433	21,250
ජාතික ආරක්ෂාව	163,565	-	163,565
එකතුව	**259,530**	**88,217**	**347,747**

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

ආයතනික වියදම්

ඉන්ධන, විදුලි බලය, ප්‍රවාහන, ගමන් වියදම්, ගොඩනැගිලි සඳහා කුලී ගෙවීම් ඇතුළු උපයෝගීතා සහ සේවා සඳහා 2012 වසරේ රජයේ ආයතනික වියදම, මුළු වියදමින් සියයට 8.9 කි. 2011 දී සියයට 6 ක්වූ මේ අගය, ඒ අනුව 2012 දී යම් වැඩිවීමක් පෙන්නුම් කරයි. සමස්තයක් ලෙස ආයතනික වියදම් වැඩිවීම සඳහා දිවයින පුරා ක්‍රියාත්මක සීඝ්‍ර සංවර්ධන ක්‍රියාවලිය, වැඩි වූ ඉන්ධන, විදුලිබල ගාස්තු හා ප්‍රවාහන වියදම්, තොරතුරු තාක්ෂණය හා වායුසමීකරණ සඳහා වන වැය මෙන්ම, විශාල සංඛ්‍යාවක් වූ රාජ්‍ය සේවකයන් සඳහා පහසුකම් සැපයීම ආදිය හේතු වී ඇත.

පැවරුම් සහ සහනාධාර

අධ්‍යාපන, සෞඛ්‍ය, කෘෂිකර්ම, ප්‍රවාහන අංශවල සහනාධාර සහ සමාජ ආරක්ෂණ වැඩසටහන් සඳහා වූ වියදම් මෙම කාණ්ඩයට ඇතුලත් වේ.

2012 වර්ෂයේ මුළු පුනරාවර්තන වියදමින් සියයට 20.8 ක් මේ සඳහා වැයකර ඇත. 2009 සිට 2011 දක්වා කාලසීමාව තුල මේ සඳහා වැයවූ සාමාන්‍ය වියදම සමග සංසන්දනය කළවිට, 2012 වර්ෂයේදී එය සියයට 14.4 කින් ඉහළ යාමක් වාර්තා කර ඇත. 2012 වර්ෂය සඳහා විශ්‍රාම වැටුප්වල සහ සුභසාධන ආධාරවල ඉහළයාම මෙම වර්ධනය සඳහා හේතු වී ඇත. සමාජ ආරක්ෂණ සහ සුභසාධන වියදම් සඳහා 2012 වසරේදී රුපියල් බිලියන 172 ක් වැය කර ඇත. ඉන් රුපියල් බිලියන 125 ක්, විශ්‍රාම වැටුප් ගෙවීම සහ මියගිය හා ආබාධිත රණවිරුවන් සඳහා වූ වැටුප් සහ සුභසාධන වියදම් වෙනුවෙන් වැයකර ඇත. නොමිළයේ ඖෂධ ලබාදීම, සමෘද්ධි මූල්‍යාධාර, 2012 වර්ෂයේදී හඳුන්වා දෙන ලද ආරක්ෂක සේවා නියුක්තිකයන්ගේ දෙමව්පියන් සහ වයස අවුරුදු 70 ට වැඩි වැඩිහිටියන් සඳහා වූ නව සුභසාධන යෝජනා ක්‍රම සහ දැනට ක්‍රියාත්මක සමෘද්ධි මූල්‍යාධාර වැඩසටහනේ කරන ලද සංශෝධනයන් වෙනුවෙන් ඉතිරිය වැය කර ඇත. මෙය සියයට 8.4 ක වැඩිවීමකි.

ධීවර, කෘෂිකර්ම සහ අනෙකුත් අංශ සඳහා සපයන ලද සහනාධාර සඳහා වූ වියදම රුපියල් බිලියන 48 ක් වූ අතර, ඉන් බිලියන 36 ක් පොහොර සහනාධාරය සඳහා වැය විය. 2012 වර්ෂයේ කෘෂිකර්ම අංශය සඳහා වූ සහනාධාර ප්‍රමාණය 2011 වර්ෂය හා සසඳන විට සියයට 12 කින් ඉහළ ගොස් ඇත. තවද, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සහ දුම්රිය දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් අලාභය පියවීම සඳහා සැලකිය යුතු ප්‍රමාණයක සහනාධාර, ප්‍රවාහන අංශය වෙනුවෙන් ලබාදී ඇත.

2.7.2 රාජ්‍ය වියදම් කළමනාකරණය

අයවැය සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් (භාණ්ඩාගාර විවිධ වියදම් වැය අයිතමය) වැය විෂයය පවත්වාගෙන යාම දූරදර්ශී ලෙස රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීම සඳහා භාණ්ඩාගාරය විසින් භාවිතා කරන ලද ක්‍රමෝපායන් අතරින් එක් ක්‍රමෝපායකි. එමගින් පරිපූරක ඇස්තමේන්තු පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමකින් තොරව වර්ෂය තුලදී ඇතිවන විවිධ අනපේක්ෂිත හා හදිසි මුල්‍ය අවශ්‍යතාවයන් කළමනාකරණය කර ගැනීමට හැකි විය.

මෙම ක්‍රමෝපාය මගින් වාර්ෂික අයවැය සකස් කිරීමේදී පසුගිය වියදම් ප්‍රවණතාවයන් හඳුනා ගැනීම තුලින් යම් නිශ්චිත ප්‍රතිපාදන ප්‍රමාණයක් වාර්ෂික වියදම් ලෙස ඇස්තමේන්තු කරනු ලැබේ. ඒ අනුව වාර්ෂික අයවැය හිඟය සහ අනිකුත් මුල්‍ය ඉලක්කයන් සැලසුම් කිරීමට හැකි වේ. මෙවැනි ප්‍රයත්නයන් හඳුනා නොගතහොත්, අපේක්ෂිත රාජ්‍ය මුල්‍ය ඉලක්කයන් ළඟාකර ගැනීම කෙරෙහි අහිතකර ලෙස බලපාන අතර, මුල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා අධ්‍යයනයකින් තොර ක්‍රමවේදයන් අනුගමනය කිරීමට රජයට සිදුවේ.

2.7.3 මුල්‍ය බැඳීම් කළමනාකරණය

මුල්‍ය හා සංවර්ධන ප්‍රතිලාභ ක්‍රමවත් පරිදි ළඟාකර ගැනීම සඳහා තිරසාර රාජ්‍ය මුල්‍ය කළමනාකරණයක් අවශ්‍ය වේ. භාණ්ඩාගාරයේ අනුදැනුමකින් තොරව හා අයවැය ප්‍රතිපාදන වෙන්වී තිබේද යන්න තහවුරු කරගැනීමකින් තොරව විවිධ ආයතන විසින් මුල්‍ය බැඳීම්වලට එළඹීම නිරීක්ෂණය කරන ලදී. එබැවින් මෙවැනි වියදම් සැලසුම් කිරීමට, සහ ඒවාට ප්‍රමුඛත්වය ලබාදීමටත් මැදිකාලීන අයවැය සකස් කිරීමේ ක්‍රියාවලිය හඳුන්වා දී ඇත. තවද, වියදම් සැලසුම්, අයවැය සීමාවන් ඇතුලත ක්‍රියාත්මක කිරීම සඳහා වියදම් දරනු ලබන ආයතන හා භාණ්ඩාගාරය අතර මනා සම්බන්ධීකරණයක් තිබීම අවශ්‍ය වේ. ඒ අනුව, අයවැය මගින් සපයා දී ඇති ප්‍රතිපාදන ප්‍රමාණයන්, ප්‍රසම්පාදන ක්‍රියාවලිය, ගිවිසුම්ගත බැඳීම් කළමනාකරණය හා මුදල් නිදහස් කිරීම මත රඳා පවතින මුල්‍ය බැඳීම් කළමනාකරණය, අක්මුදල් නිදහස් කිරීම පාලනය කිරීමට අමතරව වැඩිදියුණු කරන ලද රාජ්‍ය මුල්‍ය කළමනාකරණයක් ස්ථාපිත කිරීම අරමුණු කර ක්‍රියාවට නංවන ලදී.

2012.02.16 දිනැති අයවැය චක්‍රලේඛ අංක 156 මගින් ඉන්ධන හා විදුලිය සඳහා අපේක්ෂිත වියදම් කළමනාකරණය කිරීමටත්, විශේෂයෙන්ම අනුමත කරන ලද අයවැය සීමාවන් තුල පුනරාවර්තන වියදම් කළමනාකරණය කිරීමටත් උපදෙස් ලබා දී ඇත.

අඩු වියදමකින් ඉන්ධන හා විදුලිය පාරිභෝජනය කිරීමේ ජාතික අවශ්‍යතාවය පෙරදැරිව, ඒ සඳහා රජයේ සියළු ආයතනයන්හි සහාය ලබාගැනීම වස් මෙම චක්‍රලේඛය නිකුත් කර ඇති අතර, අන්තර්ජාතික වෙළඳපොල මිළ ගණන් හා ආනයන වියදම් අනුව උච්ඡාවචනය වන තෙල් මිල හා විදුලි ගාස්තු සඳහා සාර්ථකව මුහුණදීමට ගත් ක්‍රියාමාර්ගයක් ලෙස හැඳින්විය හැකිය. ඉන්ධන හා විදුලිය පාරිභෝජන මිල ඉහළ නැංවීමේ ප්‍රධාන අරමුණ වූයේ බලශක්ති නිපදවීම සඳහා ඛනිජ තෙල් ආනයනය කිරීම වෙනුවෙන් වාර්ෂිකව වැය වන විදේශ විනිමය අවම කර ගැනීමයි. එබැවින්, රාජ්‍ය සේවා සැපයීම් ක්‍රියාවලිය තුල මෙවැනි වියදම් අරපිරිමැසුම්දායී ලෙස කිරීම නොවැළැක්විය හැකිය.

ඒ අනුව, ඉන්ධන හා විදුලිය සඳහා වන වියදම්, 2012 වර්ෂයේ ජනවාරි මස දරණ ලද සත්‍ය වියදම් පදනම්ව, එම සීමාවන් නොඉක්මවන පරිදි, 2012 අයවැය ප්‍රතිපාදන ඇතුලත කළමනාකරණය කරගැනීම සියළු අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ වගකීමක් විය. මේ සඳහා දිනපතා කාර්යාලයීය කළමනාකරණය, ක්ෂේත්‍ර චාරිකා, සම්මන්ත්‍රණ හා වැඩමුළු සඳහා භාවිතා කරන සංචිත වාහන ප්‍රමාණය අඩු කිරීම සියළු ආයතන විසින් සිදුකරන ලදී. තවද, බලශක්ති සංරක්ෂණය සඳහා වන ජාතික ප්‍රමුඛතාවය හඳුනාගනිමින්, ඉන්ධන, විදුලිය හා වායුසමීකරණ පාවිච්චිය සඳහා වන වියදම් කළමනාකරණය කර ගනිමින්, අපේක්ෂිත ප්‍රතිලාභ ළඟා කරගැනීම අත්‍යවශ්‍ය කරුණක් විය.

2.7.4 අයවැය චක්‍රලේඛය නිකුත් කිරීම

වැය ආයතනයන්හි වඩා හොඳ වියදම් හා සේවක මණ්ඩල කළමනාකරණයක් සඳහා මාර්ගෝපදේශ ලබාදෙනු වස් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් අයවැය චක්‍රලේඛයන් 2012 වර්ෂයේදී නිකුත් කරන ලදී.

දිනය	චක්‍රලේඛ අංකය	නාමය
2012.02.16	156	ඉන්ධන හෝ විදුලිය සඳහා වියදම් කළමනාකරණය
2012.12.28	157	2013 වර්ෂයේ වියදම් දැරීම සඳහා අධිකාරි බලය ලබා දිම සහ රාජ්‍ය වියදම් කළමනාකරණය

2.7.5 පරිපූරක ඇස්තමේන්තුව

වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් 2012 වර්ෂය භාණ්ඩාගාරයට විශේෂ වර්ෂයක් විය. පරිපූරක ඇස්තමේන්තු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමකින් තොරව, 2012 වර්ෂය සඳහා අනුමත අයවැය සීමාවන් තුළ අතිරේක අරමුදල් වෙන් කිරීමකින් තොරව ගංවතුර වැනි අනපේක්ෂිත අවස්ථාවන් සඳහා අරමුදල් සලසන අතරම, අනෙකුත් ප්‍රධාන සංවර්ධන කටයුතු අඛණ්ඩව කරගෙන යාම සඳහා අවශ්‍ය වූ වියදම් ආයතන සඳහා අතිරේක ප්‍රතිපාදන වශයෙන් ලබාදීමේ දී පැවැති ප්‍රතිපාදන කළමනාකරණය කරගැනීමට භාණ්ඩාගාරයට හැකි විය. 2012 වර්ෂය සඳහා අනුමත වියදම් උපරිම සීමාව තුළ අයවැය සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම්/ භාණ්ඩාගාර විවිධ වැය විෂය යටතේ වූ ප්‍රතිපාදන තුළ සිදු කිරීමට කටයුතු කරන ලදී.

2.7.5.1 හදිසි අවශ්‍යතා වැය විෂයය - 2012

2012 වර්ෂයේ අයවැය සහාය සේවා හා හදිසි අවශ්‍යතා වගකීම් සඳහා වූ සමස්ත ඇස්තමේන්තුව රුපියල් බිලියන 72.9 ක් වූ අතර, එයින්, රුපියල් බිලියන 51.8 ක් පුනරාවර්තන වියදම් සඳහා ද, රුපියල් බිලියන 21.1 ක් මූලධන වියදම් සඳහා ද විය. සමහර වැය ආයතනවල අනුමත ඇස්තමේන්තු තුළ භාවිතයට ගෙන නැති, හඳුනාගත් ප්‍රතිපාදන අතිරේක ප්‍රතිපාදන අවශ්‍ය වැය විෂයයන් සඳහා කළමනාකරණය කරන ලදී. මෙසේ නැවත වෙන් කිරීම මගින් ප්‍රාග්ධන වියදම් සඳහා අවශ්‍ය වූ රුපියල් බිලියන 39.67 ක හා වර්තන වියදම් වූ රුපියල් බිලියන 32.22 ක අතිරේක ප්‍රතිපාදන භාණ්ඩාගාර විවිධ වැය විෂය හරහා ලබාදෙන ලදී. මේ අනුව, පාර්ලිමේන්තුව මගින් 2012 වර්ෂය සඳහා අනුමත ණය සීමාවන් සහ ඇස්තමේන්තු සීමාවන් තුළ සත්‍ය වියදම කළමනාකරණය කර ගැනීමට හැකි විය.

2.8 අත්තිකාරම් ගිණුම් අධීක්ෂණය

අත්තිකාරම් ගිණුම් අධීක්ෂණය 2012 වර්ෂයේ දී අයවැය දෙපාර්තමේන්තුවේ විෂය පථය යටතට අයත් විය. රාජ්‍ය නිලධාරීන් සඳහා වන අත්තිකාරම් ගිණුම් 190 ක්, වාණිජ අත්තිකාරම් ගිණුම් 4 ක්, ගබඩා අත්තිකාරම් ගිණුම් 3 ක් සහ විශේෂ අත්තිකාරම් ගිණුම් 04 කින් සමන්විත අත්තිකාරම් ගිණුම් 201 ක් පවත්වාගෙන යාම සඳහා දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සපයා ඇති අතර ඒ සඳහා රුපියල් මිලියන 18,070 ක් වෙන් කරන ලදී. අත්තිකාරම් ගිණුම සඳහා සීමා නිර්ණය, එම සීමාවන්ගේ සංශෝධනයන් පිළිබඳ අධීක්ෂණය කිරීම, විගණකාධිපතිවරයාගේ වාර්තා අනුව අවශ්‍ය පසු විපරම් කටයුතු සිදු කිරීම දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද කාර්යයන් අතර විය. මෙම වර්ෂය තුළදී රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් 21 ක සීමාවන් හා වෙනත් අත්තිකාරම් ගිණුම් 07 ක සීමාවන් සංශෝධනය කිරීමට පියවර ගෙන ඇත. 2012 අත්තිකාරම් ගිණුම් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව විමර්ශනය කිරීම සඳහා රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීම්වලටද දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගී විය.

3. 2013 වසර සඳහා අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම

ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය බවට පත්කිරීම සඳහා වූ රජයේ වගකීම් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් 2013 වසර සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කරන ලදි. 2006 වසරේදී ආරම්භ කරන ලද මධ්‍යකාලීන වියදම් රාමුවෙහි 8 වන වර්ෂය ලෙස 2013 අයවැය සලකන ලදි. මෙම අයවැය මගින් සමතුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් තහවුරු කිරීම සඳහා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කරන අතර උපාය මාර්ගික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති කඩිනම් කිරීම, ජීවන මට්ටම ඉහළ නැංවීම සහ කඩිනම් පුනරුත්ථාපන සහ නැවත පදිංචි කිරීමේ වැඩසටහන් මගින් දිවයින පුරා ආර්ථික ක්‍රියාකාරකම් නැවත ස්ථාපනය කිරීම කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර ඇත.

3.1 අයවැය සම්පාදනය කිරීමේ මාර්ගෝපදේශ

2012 සම්මත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු සම්පාදනය කිරීමේ අයවැය චක්‍රලේඛයක් නිකුත් කොට නොමැත. සෑම විශේෂ උපදෙසක්ම රැගත් පෞද්ගලික ලිපියක මාර්ගයෙන් 2012 සඳහා සිය ඇස්තමේන්තු සකස් කිරීමේ මාර්ගෝපදේශ ලබාදෙමින් සෑම අමාත්‍යාංශයකම ලේකම්වරුන් පුද්ගලිකව ආමන්ත්‍රණය කොට ඇත. 2013 සඳහා ඇස්තමේන්තු කෙටුම්පත 2012.12.08 දින පාර්ලිමේන්තුවෙන් අනුමත විය.

2012 අයවැය සම්පාදනයේදී වියදම් ප්‍රබේද සඳහා පහත සඳහන් විශේෂ මාර්ගෝපදේශ සලකා බලන ලදී.

පුනරාවර්තන වියදම් - වැටුප්, වේතන හා අනෙකුත් දීමනා 2012 ජුනි 30 දිනට සිටින සේවක සංඛ්‍යාව පදනම් කරගෙන ගණනය කළ අතර, 2012 වර්ෂය සඳහා අනුමත නව බඳවා ගැනීම් වෙන් වෙන් වශයෙන් හඳුනා ගන්නා ලදී.

ප්‍රාග්ධන වියදම්

- දැනටමත් ආරම්භ කර ඇති ප්‍රාග්ධන ව්‍යාපෘති නිමාවට පත් කිරීම සඳහා ප්‍රමුඛතාවය දීම.
- 2012.08.01 දින වනවිට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ඇති නව ව්‍යාපෘති පමණක් ඇතුළත් කිරීම.
- ආංශික ප්‍රතිපාදන මනා ලෙස බෙදා හැරෙන බව තහවුරු කිරීම සඳහා වැය නියෝජිතායතන හා පළාත් සභා විසින් භාරගෙන ඇති ව්‍යාපෘති හා වැඩසටහන් සම්බන්ධ ද්විකරණ හා උපරිපතන වැළැක්වීම.
- හිඟ බැරකම් සඳහා මෙන්ම අපනයන තීරු බදු හා බදු සඳහා ඉදිරි අවශ්‍යතාවන් සඳහා තත්‍ය ප්‍රතිපාදන සැලසීම.

2012 අයවැය සම්බන්ධව මෙම දෙපාර්තමේන්තුව මගින් සමාලෝචනයක් සිදු කරන ලද අතර අමාත්‍යාංශවල අවශ්‍යතා මනා ඇගයීමකට ලක්කර එය පදනම් කරගනිමින් අමාත්‍යාංශ සඳහා දළ ඇස්තමේන්තුවක් සකස් කරන ලදී. 2012 අගෝස්තු මැදභාගය වනවිට සෑම අමාත්‍යාංශයක් වෙතම මෙම සකස් කරන ලද අයවැය, එය සකස් කිරීමට භාවිතා කරන ලද උපකල්පනයන් ද සහිතව සවිස්තරාත්මක ලිපියක් සමග අමාත්‍යාංශ වෙත යවන ලද අතර මෙම අයවැය පදනම් කරගනිමින් අදාල අමාත්‍යාංශවල ඇස්තමේන්තු කෙටුම්පත් 2012 සැප්තැම්බර් මාසය වනවිට මෙම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලෙස ඉල්ලීමක් කරන ලදි.

04. විශේෂ ක්‍රියාකාරකම්

4.1 වාණිජමය නොවන රාජ්‍ය ව්‍යාපාරයන්හි අයවැය කළමනාකරණය

2012 වර්ෂය තුළ වාණිජමය නොවන රාජ්‍ය ව්‍යාපාර (ව්‍යවස්ථාපිත මණ්ඩල) 122 ක රාජ්‍ය මූල්‍ය හා අයවැය කළමනාකරණය සම්බන්ධ සෑම කරුණක්ම ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලදී. මෙම ආයතන සම්බන්ධ පහත දැක්වෙන කාර්යයන් ඔවුන්ගේ මූල්‍ය හා කළමනාකරණ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලදී.

- ව්‍යවස්ථාපිත මණ්ඩලවල වාර්ෂික අයවැය, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, වාර්ෂික ගිණුම්, සංයුක්ත සැලැස්ම හා වාර්ෂික වාර්තාව යනාදිය පරීක්ෂා කිරීම හා පාලනය කිරීම මගින් එම ආයතනවල කාර්ය සාධනය හා ප්‍රගතිය සමාලෝචනය කිරීම.
- මෙම ආයතනයන්හි ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් සඳහා මාසික අග්‍රිම මුදල නිදහස් කර ගැනීමට කරන ඉල්ලීම පරීක්ෂාකර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

- 1971 අංක 38 දරන මුදල් පනත අනුව රුපියල් 500,000 ට වැඩි ප්‍රාග්ධන වියදම් සඳහා අවශ්‍ය අනුමැතිය ලබාදීම.
- පාර්ලිමේන්තුවේ රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ වූ කාරක සභාව (COPE) විසින් ව්‍යවස්ථාපිත මණ්ඩල සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා රැස්වීම් කැඳවන අවස්ථාවන්හිදී එම ව්‍යවස්ථාපිත මණ්ඩලවල මූල්‍යමය කාර්ය සාධනය සහ කළමනාකරණය පිළිබඳව වාර්තා සැකසීම හා එම වාර්තා ඉහත කාරක සභාවට ඉදිරිපත් කිරීම.

- මෙම ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අවශ්‍ය නව රථ වාහන මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදීම.

- මෙම වාණිජ නොවන රාජ්‍ය ව්‍යාපාර සඳහා අවශ්‍යතා අනුව මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ නව වාහන මිලදී ගැනීම හා භාරදීම.

- විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්ෂික වාර්තාව සහ මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලබන විශේෂ විගණන විමසුම් සමාලෝචනය කිරීම සහ එම ගැටළු මග හරවා ගැනීමට මෙන්ම ඉදිරියේදී ඇතිවීම වැළැක්වීම සඳහා ගතයුතු ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් අදාල ව්‍යවස්ථාපිත ආයතන දැනුවත් කිරීම.

- ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා නව සේවකයින් බඳවා ගැනීමේදී අවශ්‍යතාව හා ඒ සඳහා පවත්නා අයවැය ප්‍රතිපාදන මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ලබාදීම.
- විවිධ කාර්යයන් (පුහුණු, රැස්වීම්, සම්මන්ත්‍රණ, සම්මේලන ආදිය) සඳහා විදේශ ගමන් වල යෙදීම උදෙසා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාදීම.
- මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වැනි විශේෂිත වූ කළමනාකරණ හා මූල්‍යමය ගැටළු පිළිබඳ උපදෙස් දීම හා සම්බන්ධීකරණය කිරීම.

4.1 වගුව
2012 කාර්ය සාධනය

ක්‍රියාකාරකම	සංඛ්‍යාව
1. මුදල් පනත අනුව දරන ලද මූලධන වියදම් සඳහා අනුමැතිය ලබාදීම	117
2. රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කමිටු (COPE) සඳහා වාර්තා පිළියෙල කිරීම	109
3. රථ වාහන මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදීම	129
4. මාසික මුදල් අග්‍රිමය නිදහස් කිරීම සඳහා නිර්දේශ ලබාදීම	1,354
5. මූල්‍ය කල්බදු ක්‍රමවේදය යටතේ වාහන නිකුත් කිරීම	259

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

4.2 අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ

2012 වර්ෂය තුළදි මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ අමාත්‍ය මණ්ඩල සංදේශ 256 ක් සඳහා නිරීක්ෂණ සකස් කරන ලදී. අමාත්‍ය මණ්ඩල සංදේශ 240 ක් සඳහා මෙම දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ අනෙකුත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවලට ලබාදෙන ලදී.

4.3 2013 "දැයට කිරුළ සංවර්ධන" වැඩසටහන සම්බන්ධීකරණය කිරීම

දැයට කිරුළ සංවර්ධන වැඩසටහනට අදාලව පූර්ව සාකච්ඡා සංවිධානය කිරීම, වැඩසටහන් ක්‍රියාත්මක කළයුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම, අදාළ ක්ෂේත්‍රවල නව සංවර්ධන ව්‍යාපෘති හා ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති හඳුනා ගැනීම, කඩිනම් කිරීම හා ප්‍රමුඛතාව දීම, අමාත්‍ය මණ්ඩල සංදේශ සකස්කර භාරදීම, ජාතික මෙහෙයුම් කමටුව හා ප්‍රසම්පාදන කමිටුවට සහභාගීවීම හා අරමුදල් කළමනාකරණය සම්බන්ධ සියලු කටයුතු වැනි දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහනේ සම්බන්ධීකරණ කටයුතුවල ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලදී.

4.4 වාහන මිලදී ගැනීම සඳහා අනුමැතිය

4.4.1 වාහන ප්‍රසම්පාදනය සඳහා ජාතික අයවැය අනුමැතිය

1990 ජනවාරි 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, රජයේ ආයතන විසින් වාහන මිලදී ගැනීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව අනුමැතිය ලබා දෙන ලදී. මේ අනුව සියලු අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ප්‍රාදේශීය සභා, පළාත් පාලන ආයතන සහ තම මූල්‍ය සම්පත් මත යැපෙන හා එසේ නොවන සියලු ව්‍යවස්ථාපිත මණ්ඩල, සංස්ථා, රජය සතු සමාගම්(GOC) වාහන මිලදී ගැනීම සඳහා පූර්ව අනුමැතිය ලබාගත යුතුය. ජාතික අයවැය දෙපාර්තමේන්තුව විවිධ රාජ්‍ය ආයතන විසින් වාහන සම්පාදනය සඳහා කරන ඉල්ලීම් සමාලෝචනය කර අනුමැතිය ලබාදීම සිදු කරයි.

2012 වර්ෂය තුලදී, වාහන 713 ක් මිලදී ගැනීම සඳහා දෙපාර්තමේන්තුව අනුමැතිය ලබාදී තිබේ.

4.2 වගුව
ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද වාහන - වාහන වර්ගය අනුව

වාහන වර්ගය	අනුමැතිය ලබාදුන් වාහන සංඛ්‍යාව
මෝටර් කාර් රථ	81
වෑන් රථ	18
බස් රථ	04
කැබ් රථ (Single,Double,Crew cabs)	123
ත්‍රීරෝද රථ	49
ලොරි/ට්‍රක් රථ	29
යතුරු පැදි	334
ගිලන් රථ	10
ජීප් රථ	-
වෙනත් (ට්‍රැක්ටර්/ට්‍රේලර්, වතුර බවුසර) යනාදිය	65
එකතුව	**713**

මූලාශ්‍රය - ජාතික අයවැය දෙපාර්තමේන්තුව

4.4.2 මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ රාජ්‍ය ආයතන වෙත සපයන ලද වාහන

රාජ්‍ය අංශයේ ආයතනවලට වාහන සැපයීම කළමනාකරණය සහ කාර්යක්ෂමව සිදුකිරීමේ අවශ්‍යතාවය සැළකිල්ලට ගනිමින් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ වාහන මිළදී ගැනීම සඳහා 2010.08.30 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී ඇත. මෙම තීරණය ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2010.12.07 දින අංක 150 දරණ චක්‍රලේඛය මගින් බලාත්මක කර ඇත. මෙම වාහනවල වියදම වසර 5 ක් තුළ මාසික වාරික වශයෙන් ගෙවිය හැකි බැවින්, මෙමගින් රජයේ මූල්‍ය ප්‍රවාහයට වන බලපෑම අවම වන අතර, වසර 5 අවසානයේදී අදාළ රාජ්‍ය ආයතනවලට වාහනවල හිමිකම පැවරෙනු ඇත.

වාහන වර්ගය	වාහන සංඛ්‍යාව
වෑන්	267
මෝටර් රථ (කාර්)	625
ඩබල් කැබ් රථ	1140
ජීප් රථ	27
ගිලන්රථ	250
එකතුව	**2,309**

මූලාශ්‍රය - ජාතික අයවැය දෙපාර්තමේන්තුව

ඒ අනුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව රාජ්‍ය ආයතන සඳහා වාහන මිළදී ගැනීම පිණිස රාජ්‍ය කල්බදු ආයතන වන ලංකා බැංකුව සහ මහජන බැංකුවට අනුබද්ධිත මහජන කල්බදු සමාගම මගින් තරඟකාරී ලංසු කැඳවන ලදී. මූල්‍ය කල්බදු ක්‍රමය මගින් වසර 5 ක් තුල සමාන මාසික වාරික ගෙවීම යටතේ 2010 - 2012 කාලය තුල රුපියල් මිලියන 8,500 ක වටිනාකමින් යුත් වාහන 2,309 ක් මිළදී ගෙන ඇත. ජාතික අයවැය දෙපාර්තමේන්තුව අදාළ රාජ්‍ය ආයතන සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව සිදුකරන ලද අවශ්‍යතා ඇගයීම් පදනම් කරගනිමින්, මිළදී ගන්නා ලද ඉහත වාහන රාජ්‍ය ආයතන අතර බෙදාදී ඇත.

4.5 අධ්‍යක්ෂ මණ්ඩල හා කමිටු සඳහා නිලධාරී සහභාගිත්වය

ව්‍යවස්ථාපිත මණ්ඩල, ආයතන, රාජ්‍ය සංස්ථා, රජය සතු සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් (භාණ්ඩාගාර නියෝජිතයන්) වශයෙන් බොහෝ මාණ්ඩලික නිලධාරීන් සේවය කරන අතර, ඇතැම් නිලධාරීන් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන ටෙන්ඩර් මණ්ඩලවලද, තාක්ෂණික ඇගයීම් කමිටුවලද භාණ්ඩාගාරයේ ලේකම් නියෝජනය කරමින් සේවය කරති. ඊට අමතරව දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ (COPA) හා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කමිටුවෙහි (COPE) පෙනී සිටිති.

5. ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය සහ කාර්යභාරය

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සහ සංවිධාන ව්‍යුහය පහත සඳහන් පුළුල් අංශ යටතේ වර්ගීකරණය කොට ඇති අතර ඒවා විසින් රේඛීය අමාත්‍යාංශවල වියදම් ඇස්තමේන්තු නියෝජනය කරනු ලබයි.

1. රජයේ සේවා
2. ආරක්ෂාව
3. නීතිය බලාත්මක කිරීම
4. මානව සම්පත්
5. යටිතල පහසුකම්
6. පර්යේෂණ හා තාක්ෂණය
7. සමාජ ආරක්ෂණය
8. පරිසරය
9. මූර්ත ආර්ථිකය

5.1 කාර්ය මණ්ඩලය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 අනුව, 2012 වර්ෂයේදී ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය තුල පහත සඳහන් සේවා මට්ටම් යටතේ නිලධාරීන් රාශියක් සේවය කොට ඇත.

සේවා මට්ටම	නිලධාරීන් සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	22
තෘතීය මට්ටම	02
ද්විතීය මට්ටම	64
ප්‍රාථමික මට්ටම	33

2012 වසර අවසානය වනවිට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය හා සත්‍ය කාර්ය මණ්ඩලය පහත පරිදි විය.

5.1 වගුව
2012 කාර්ය මණ්ඩලය

තනතුරු නාමය	අනුමත සේවක සංඛ්‍යාව	සත්‍ය සේවක සංඛ්‍යාව
අධ්‍යක්ෂ ජනරාල්	01	01
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	03	01
අධ්‍යක්ෂ	15	12
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ	16	08
ගණකාධිකාරි	01	00
පරිපාලන නිලධාරි	01	01
භාෂා පරිවර්තක	01	01
ව්‍යාපෘති නිලධාරි	04	03
අයවැය සහකාර	38	30
පර්යේෂණ සහකාර	01	04
සංවර්ධන සහකාර	00	03
කළමනාකරණ සහකාර	40	24
රියදුරු	15	15
කාර්යාල කාර්ය සහායක	22	18
එකතුව	158	121

5.2 මානව සම්පත් සංවර්ධනය

2012 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුවට සිය කාර්ය මණ්ඩලයෙහි වෘත්තීමය කුසලතා හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීම පිණිස ඔවුන් දේශීය හා විදේශීය පුහුණුවීම් වැඩසටහන්වල පහත පරිදි යොදවන ලදී.

5.2.1 විදේශ පුහුණුව/සම්මන්ත්‍රණ/රැස්වීම්

	නිලධාරියාගේ නම	තනතුරු නාමය	වැඩසටහන	පුහුණුව ලැබූ රට	පුහුණු කාලසීමාව
1	ඒ.කේ.සෙනෙවිරත්න මයා	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	ප්‍රතිපත්ති සහ මූල්‍ය වැඩසටහන් සම්පාදනය	සිංගප්පූරුව	2012.01.09 - 2012.01.20
2	කේ.එම්.රිස්වි මයා	සහකාර අධ්‍යක්ෂ	තිරසාර සංවර්ධනයට සහායවීම	ජපානය	2012.01.08 - 2012.01.20
3	පී.එච්.ඒ.එස්.විජයරත්න මයා	අධ්‍යක්ෂ	තිරසාර සංවර්ධනය සඳහා පාරිසරික උපාය මාර්ග පිළිබඳ පුහුණුව	සිංගප්පූරුව	2012.03.05 - 2012.03.16
4	ජේ.එම්.එස්.ඩී.රත්නායක මහත්මිය	අධ්‍යක්ෂ	දකුණු ආසියාවේ සහශ්‍ර සංවර්ධන ඉලක්ක ලඟාකර ගැනීම කඩිනම් කිරීම සඳහා වූ උපකලාපීය ESCAP/ADB/UNDP ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සම්මන්ත්‍රණය	ඉන්දියාව	2012.02.17- 2012.02.18
5	ජේ.එම්.එස්.ඩී.රත්නායක මහත්මිය	අධ්‍යක්ෂ	සාක් කලාපීය දිළිඳුකම පිළිබඳ පැතිකඩ සකස් කිරීම සඳහා වූ දෙවන අන්තර් රාජ්‍ය සම්මන්ත්‍රණය	නේපාලය	2012.03.05- 2012.03.06
6	පී.කේ.ඒ.ඩී.ද සිල්වා මිය	අධ්‍යක්ෂ	යුරෝපීය සංවර්ධන මණ්ඩලයේ සමාජ ආරක්ෂණය සම්බන්ධ උපදේශක රැස්වීම	තායිලන්තය	2012.03.25 - 2012.03.28
7	ඒ.කේ.සෙනෙවිරත්න මයා	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	ආසියාවේ මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ සම්මන්ත්‍රණය	ජපානය	2012.04.25 - 2012.04.28

8	ජී.ඩී.සී.ඒකනායක මෙය	අධ්‍යක්ෂ ජනරාල්	ආසියා ප්‍රතිරක්ෂණ සංස්ථාවේ කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම	තායිලන්තය	2012.04.19 - 2012.04.21
9	එස්.පී.කිරිවත්තුඩුවගේ මයා	සහකාර අධ්‍යක්ෂ	ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන උපාය මාර්ග පිළිබඳ කණ්ඩායම් පුහුණුව	කොරියාව	2012.06.07 - 2012.06.23
10	ජේ.එම්.එස්.ඩී.රත්නායක මහත්මිය	අධ්‍යක්ෂ	ආසියා හා පැසිපික් කලාපය සඳහා වූ එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජ කොමිසමේ 68 වන සැසිය	තායිලන්තය	2012.05.16 2012.05.23
11	ජී.ඩී.සී.ඒකනායක මෙය	අධ්‍යක්ෂ ජනරාල්	ආසියානු ප්‍රතිරක්ෂණ සංස්ථාවේ පාර්ශවකරුවන්ගේ 6 වන රැස්වීම සහ කමිටු සාමාජිකයින්ගේ 35 වන රැස්වීම	තායිලන්තය	2012.06.20 - 2012.06.23
12	එම්.ආර්.ආර්.අබේවික්‍රම	අධ්‍යක්ෂ	තිරසාර ප්‍රතිශක්තිකරණ මූල්‍යකරණය පිළිබඳ දෙවන පළාත් මට්ටමේ උපදේශක රැස්වීම	කාම්බෝජය	2012.07.03- 2012.07.06
13	ඩී.සී.ඩබ්.හපුගොඩ මෙය	අධ්‍යක්ෂ	ව්‍යාපෘති සකස් කිරීම පිළිබඳ සැසිය	පිලිපීනය	2012.08.27- 2012.08.29
14	වයි.පී.සුමනාවතී මිය	අධ්‍යක්ෂ	දේශගුණික වෙනස්වීම් සඳහා කෘෂිකාර්මික අනුවර්තනය	තායිලන්තය	2012.11.19- 2012.11.23

5.2.2 දේශීය පුහුණුව

2012 වර්ෂය තුළ පහත දැක්වෙන කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා විවිධ ක්ෂේත්‍රවල දේශීය පුහුණුව ලබා දී ඇත.

	නිලධාරියාගේ නම	තනතුරු නාමය	වැඩසටහන	ආයතනය	පුහුණු කාලසීමාව
1	අයිරාංගනී පෙරේරා	රා.ක.ස.සේ.	පරිගනකගත ඒකාබද්ධ රාජ්‍ය ගිණුම් පද්ධතිය පිළිබඳව පුහුණුව	මිලෝදා	2012.02.27 2012.03.03
2	කේ.කේ.ඩී.එන්.එස්.ජයතිලක මිය	රා.ක.ස.සේ.	වැටුප් පරිවර්තනය පිළිබඳ පුහුණුව	රාජ්‍ය සේවා පුහුණු ආයතනය	2012.04.05
3	ඩී.ආර්.සමරසේකර මයා	රා.ක.ස.සේ.	වැටුප් පරිවර්තනය පිළිබඳ පුහුණුව	රාජ්‍ය සේවා පුහුණු ආයතනය	2012.04.05
4	එම්.ඩී.අබේගුණවර්ධන මෙය	සහකාර අධ්‍යක්ෂ	වෘත්තිකයින් සඳහා ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	2012.03.27 සිට දින 10 ක්
5	එස්.එච්.ඒ.අනුරුද්ධිකා මිය	රා.ක.ස.සේ.	පෞද්ගලික ලිපිගොනු පිරවීම සහ පවත්වාගෙන යාම පිළිබඳ පුහුණුව	රාජ්‍ය සේවා පුහුණු ආයතනය	2012.04.05
6	එම්.එම්.ටී.පී.එස්.පෙරේරා මෙය	රා.ක.ස.සේ.	රාජ්‍ය මුදල් කළමනාකරණය පිළිබඳ පුහුණුව	රාජ්‍ය සේවා පුහුණු ආයතනය	2012.04.23 2012.04.27
7ග	බී.එස්.පී.පෙරේරා මිය	රා.ක.ස.සේ.	මූලික පරිගණක නිපුණතාව පිළිබඳ පුහුණුව	රාජ්‍ය සේවා පුහුණු ආයතනය	2012.05.28 - 2012.06.01
8	ඒ.ත්‍යාගලිංගම් මයා	රා.ක.ස.සේ.	මූලික පරිගණක නිපුණතාව පිළිබඳ පුහුණුව	රාජ්‍ය සේවා පුහුණු ආයතනය	2012.05.28 - 2012.06.01

9	ඒ.කේ.සෙනෙවිරත්න මයා	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව	කොළඹ විශ්ව විද්‍යාලය	2010-2012
10	එන්.බී.එම්.සිරිමාන්න මිය	ප්‍රධාන රාජ්‍ය කළමනාකරණ සහකාර	ප්‍රධාන කළමනාකරණ සහකාරගේ කාර්යභාරය පිළිබඳ පුහුණුව	රාජ්‍ය සේවා පුහුණු ආයතනය	2012.08.02-2012.08.03
11	ඒ.ත්‍යාගලිංගම් මයා	රා.ක.ස.සේ.	කාර්යාල කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව	රාජ්‍ය සේවා පුහුණු ආයතනය	2012.09.03-2012.09.09
12	එම්.ඩී.අබේගුණවර්ධන මෙය	සහකාර අධ්‍යක්ෂ	ආර්ථික සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය	රුහුණු විශ්ව විද්‍යාලය	2010-2012
13	ඩී.ආර්.සමරසේකර මයා	රා.ක.ස.සේ	බඳවා ගැනීම් පටිපාටි සැකසීම පිළිබඳ පුහුණුව	රාජ්‍ය සේවා පුහුණු ආයතනය	2012.07.02
14	බී.එස්.පී.පෙරේරා මිය	රා.ක.ස.සේ.	උසස් පරිගණක පුහුණු පාඨමාලාව	රාජ්‍ය සේවාපුහුණු ආයතනය	212.08.20 - 2010.08.24
15	ඩී.අයි.ද එස්.විජේසිංහ මිය	අයවැය සහකාර	වෘත්තිකයින් සඳහා වූ පරිගණක දෘඩාංග පිළිබඳ පුහුණුව	නවීන තාක්ෂණය සඳහා වූ ආතර් සී ක්ලාක් ආයතනය	2012.08.25 සිට සති දෙකක්
16	එන්.බී.එම්.සිරිමාන්න මිය	ප්‍රධාන රාජ්‍ය කළමනාකරණ සහකාර	වැටුප් පරිවර්තනය පිළිබඳ පුහුණුව	රාජ්‍ය සේවා පුහුණු ආයතනය	2012.08.29
17	ඩී.ආර්.සමරසේකර මයා	රා.ක.ස.සේ	රාජ්‍ය සේවකයින්ගේ අත්තිකාරම් ගිණුම් කටයුතු පිළිබඳ පුහුණුව	මීලෝදා	2012.09.03
18	ඩී.ඩී.ඩී.එන්.කේ.රත්නතිලක මිය	රා.ක.ස.සේ	පරිගනකගත ඒකාබද්ධ රාජ්‍ය ගිණුම් පද්ධතිය පිළිබඳව පුහුණුව	මීලෝදා	2012.10.15

5.3 ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මූල්‍යමය පාලනය

2012 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවල අයවැය දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය මෙහෙයුම් සඳහා අවශ්‍ය අයවැය ප්‍රතිපාදන ශීර්ෂ අංක 240 යටතේ සලසා ඇත. වැඩසටහන් 2 ක් යටතේ අයවැය ප්‍රතිපාදන සලසා තිබේ.

අ. වැඩසටහන	01	- මෙහෙයුම් වැඩසටහන්
වැඩසටහනෙහි ව්‍යාපෘති	01	- අයවැය සම්පාදන හා ප්‍රතිපත්ති
ආ. වැඩසටහන	02	- සංවර්ධන ක්‍රියාකාරකම්
වැඩසටහනෙහි ව්‍යාපෘති	02	- අයවැය සහාය සේවා හා හදිසි අවශ්‍යතා වගකීම්

අයවැය සම්පාදනය හා ප්‍රතිපත්ති සම්බන්ධයෙන් වූ දෙපාර්තමේන්තු පරිපාලන වියදම් සඳහා ව්‍යාපෘති අංක 1 යටතේ, විවිධ වියදම් දැරීමේ ආයතනවල, අයවැය සහාය සේවා හා හදිසි අවශ්‍යතා වගකීම් සඳහා වන වියදම් දෙවන ව්‍යාපෘතිය යටතේද දක්වා ඇත. 2012 වාර්ෂික අයවැය කථාවේ ප්‍රකාශිත අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම හා රජයේ ප්‍රතිපත්තිමය ප්‍රමුඛතාවන් සඳහා වන වියදම සඳහා වන ප්‍රතිපාදනද එකී ව්‍යාපෘතිය යටතේම සලසා තිබුණි.

මූලික අයවැය ඇස්තමේන්තු, අයවැය යෝජනා සහ හඳුනාගත් ශීර්ෂ යටතේ වූ ඉතිරිවීම් මගින් රුපියල් 74,478,795,000 ක් 2012 වර්ෂය වෙනුවෙන් අයවැය දෙපාර්තමේන්තුවට සපයා තිබුණි.

ඉහත සමස්ත ප්‍රතිපාදනය පහත පරිදි භාවිතා කර ඇත.

	රු.
(1) වැඩසටහන 01 ව්‍යාපෘතිය 01 හි වියදම	1,477,885,934
(2) වැඩසටහන 02 ව්‍යාපෘතිය 02 යටතේ වෙනත් ශීර්ෂ වෙත ප්‍රතිපාදන නිදහස් කිරීම	71,455,976,456
එකතුව	72,933,862,390
ඉතිරි ප්‍රතිපාදන	1,544,932,610

ඒ අනුව, ඉතිරි ප්‍රතිපාදනය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 2.07 කි. මෙම ඉතිරිවීම් සඳහා ප්‍රධාන හේතුව අයවැය යෝජනාවන්හි භාවිතා නොකරන ලද ප්‍රතිපාදනයන් වේ.

5.3.1 ශීර්ෂ 240 යටතේ වියදම් සාරාංශය

ශුද්ධ ප්‍රතිපාදන සහ සත්‍ය වියදමේ සාරාංශයක් සහ ශුද්ධ ප්‍රතිපාදන සහ සත්‍ය වියදමේ වෙනසත් එම වෙනස ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙසත් පහත 5.2 වගුවෙහි දැක්වේ.

5.2 වගුව
2012 වර්ෂයේ ශීර්ෂ 240 යටතේ වියදම් සාරාංශය

1 විස්තරය	2 ශුද්ධ ප්‍රතිපාදනය රු.	3 සත්‍ය වියදම/ වෙනත් ශීර්ෂ වලට මාරුකිරීම (රු.)	4 වෙනස ඉතිරිවීම් (2)-(3) (රු.)	5 වෙනස ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස (රු.)
පුනරාවර්තන වියදම්				
ව්‍යාපෘති				
1 අයවැය සම්පාදනය සහ ප්‍රතිපත්ති	71,345,000	68,473,412	2,871,588	4.02
2 අයවැය සහාය සේවා හා හදිසි අවශ්‍යතා වගකීම්	39,209,500,000	38,706,188,772	503,311,228	1.28
පුනරාවර්තන වියදම් එකතුව	**39,280,845,000**	**38,774,662,184**	**506,182,816**	**1.29**
මූලධන වියදම් **ව්‍යාපෘති**				
1 අයවැය සම්පාදනය හා ප්‍රතිපත්ති	1,507,450,000	1,409,412,522	98,037,478	6,5
2 අයවැය සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම්	33,690,500,000	32,749,787,684	940,712,316	2.8
මූලධන වියදම් එකතුව	**35,197,950,000**	**34,159,200,206**	**1,038,749,749**	**2.95**
මුළු එකතුව	**74,478,795,000**	**72,933,862,390**	**1,544,932,610**	2.07

මූලාශ්‍රය - ජාතික අයවැය දෙපාර්තමේන්තුව

5.3.2 ව්‍යාපෘති අනුව 2012 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන සහ සත්‍ය වියදම

2012 වර්ෂයේ එක් එක් වැඩසටහන සහ ව්‍යාපෘති අනුව සලසන ලද ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සහ සත්‍ය වියදම පහත වගුවෙන් දැක්වේ. 3 වන තීරුවෙන් මූලික ඇස්තමේන්තුවට පරිපූරක ඇස්තමේන්තු සහ මු.රෙ. 66 මාරු කිරීම් ගැලපීමෙන් පසු ශුද්ධ ප්‍රතිපාදන දක්වා ඇත. ශුද්ධ ප්‍රතිපාදනය සහ සත්‍ය වියදම අතර වෙනස 5 වන තීරුවෙන් දැක්වේ.

5.3 වගුව
වැඩසටහන් 01 - මෙහෙයුම් වැඩසටහන
ව්‍යාපෘති 01 - අයවැය සම්පාදන සහ ප්‍රතිපත්ති

(1) විස්තරය	(2) ඇස්තමේන්තුව රු.	(3) ශුද්ධ ප්‍රතිපාදනය රු.	(4) සත්‍ය වියදම රු.	(5) ඉතිරි කිරීම් (3) - (4) රු.	(6) වෙනස ප්‍රතිශතයක් ලෙස %
පුනරාවර්තන වියදම්					
පුද්ගල පඩිනඩි	52,500,000	53,080,000	51,210,519	1,869,481	3.52
වෙනත් පුනරාවර්තන වියදම්	18,845,000	18,265,000	17,262,893	1,002,107	**5.48**
පුනරාවර්තන වියදම් එකතුව	**71,345,000**	**71,345,000**	**68,473,412**	**2,871,588**	**9.00**
මූලධන වියදම් ***මූලධන වත්කම් පුනරාවර්තන හා වැඩිදියුණු කිරීම***					
ගොඩනැගිලි යන්ත්‍රෝපකරණ	500,000	500,000	-	500,000	100
වාහන	500,000	500,000	489,063	10,937	2.18

(1) විස්තරය	(2) ඇස්තමේන්තුව රු.	(3) ශුද්ධ ප්‍රතිපාදනය රු.	(4) සත්‍ය වියදම රු.	(5) ඉතිරි කිරීම් (3) - (4) රු.	(6) වෙනස ප්‍රතිශතයක් ලෙස %
ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම					
වාහන	1,000,000,000	1,500,000,000	1,403,221,379	96,778,621	6.45
ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ	5,000,000	5,607,000	5,584,780	22,220	0.4
		31			
යන්ත්‍රෝපකරණ	850,000	671,000	-	671,000	100
නිපුණතා සංවර්ධනය					
පුහුණු කිරීම් හා හැකියා වර්ධනය	600,000	172,000	117,300	54,700	31.8
මූලධන වියදම් එකතුව	1,007,450,000	1,507,450,000	1,409,412,522	98,037,478	6.50
මුළු වියදම	1,078,795,000	1,578,795,000	1,477,885,934	100,909,066	6.39

මූලාශ්‍රය - ජාතික අයවැය දෙපාර්තමේන්තුව

ඉහත වගුවෙන් දක්වා ඇති පරිදි වැඩසටහන් 01 හි ව්‍යාපෘති 01 යටතේ සලසා තිබූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 93.61 ක් පරිහරණය වී ඇත.

5.4 වගුව
වැඩසටහන 02 යටතේ වියදම - සංවර්ධන කටයුතු
ව්‍යාපෘති 02 - අයවැය සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම්

1 විස්තරය	2 ශුද්ධ ප්‍රතිපාදනය රු.	3 වෙනත් ශීර්ෂවලට මාරුකිරීම රු	4 ඉතිරිවීම(විසර්ජන ගිණුම අනුව) රු	5 වෙනස ප්‍රතිශතයක් ලෙස %
පුනරාවර්තන වියදම්				
වෙනත් පුනරාවර්තන වියදම්	39,209,500,000	38,706,188,722	503,311,228	1.28
මුළු පුනරාවර්තන වියදම්	**39,209,500,000**	**38,706,188,722**	**503,311,228**	**1.28**
ප්‍රාග්ධන වියදම්				
වාහන අත්පත්කරගැනීම්	1,240,000,000	1,200,503,467	39,496,533	3.18
ප්‍රතිව්‍යුහකරණය				
පසුබෑමට ලක්වූ ව්‍යාපාර සඳහා බැරකම්	30,000,000	30,000,000	-	-
විදේශාධාර ආශ්‍රිත වියදම්				
- විදේශාධාර ණය (12)	9,200,000,000	8,996,721,728	203,278,272	2.21
- විදේශාධාර ප්‍රදාන (13)	409,000,000	302,152,210	106,847,790	26.12
- ප්‍රතිපූර්ණ විදේශාධාර ණය (14)	95,000,000	95,000,000	-	-
- ප්‍රතිපාර්ශවීය අරමුදල් (16)			-	-
- විදේශාධාර සබැඳි දේශීය අරමුදල් (17)	4,549,700,000	4,549,399,631	300,369	.007
වෙනත් අනපේක්ෂිත ගෙවීම් (11)	18,166,800,000	17,576,010,648	590,789,352	3.25
ප්‍රාග්ධන වියදම් එකතුව	**33,690,500,000**	**32,749,787,684**	**940,712,316**	**2.79**
මුළු එකතුව	**72,900,000,000**	**71,455,976,406**	**1,444,023,544**	**1.98**

මූලාශ්‍රය - ජාතික අයවැය දෙපාර්තමේන්තුව

මෙම ව්‍යාපෘතිය යටතේ විවිධ වියදම් දැරීමේ ආයතනවල අනපේක්ෂිත සහ බලාපොරොත්තු නොවූ වියදම් දැරීම සඳහා සහ 2012 අයවැය කතාවෙන් ප්‍රකාශිත යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් 72,900,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. මෙම ප්‍රමාණයෙන් රුපියල් 71,455,976,406 ක් විවිධ වියදම් දැරීමේ ආයතන වෙත නිදහස් කර තිබුණි. එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 98.02 කි.

5.5 වගුව

2012 වර්ෂය සඳහා රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

ප්‍රබේදය	2012 අනුමත සීමාව රු.	සත්‍ය වියදම 2012 රු.
උපරිම වියදම් සීමාව	7,000,000	3,968,834.00
අවම ලැබීම් සීමාව	3,700,000	4,813,623.75
උපරිම හර ශේෂ සීමාව	35,000,000	22,223,115.02

32

අංක 114 හා 2003.12.31 දිනැති අයවැය චක්‍රලේඛය පරිදි, දෙපාර්තමේන්තු ශීර්ෂය තුළ සිදු වූ ගණුදෙනු පමණක් සලකා බලා, අයිතම 240-011 දරන අත්තිකාරම් ගිණුම් විෂයාංකයෙහි සංඛ්‍යාවන් ඉහත වගුවෙහි දක්වා ඇත. අංක 114 දරන චක්‍රලේඛයට අනුව, ස්ථාන මාරු වී ගිය සහ පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂයන් ගිණුම් ශීර්ෂ අතර නිරවුල් කිරීම විෂයාංක 240-012 යටතේ ගිණුම්ගත කරන ලදී. 2012 වර්ෂය අතරතුර එම හර ශේෂයන්ගේ අගය රුපියල් 3,874,959.90 ක් වූ අතර බැර ශේෂයන්හි අගය රුපියල් 3,947,234.00 ක් විය. ඒ අනුව රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම යටතේ ලබා දී ඇති සීමාවන්ට අනුකූලව දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.

5.6 වගුව

2012 වර්ෂයේදී දෙන ලද ණය ප්‍රමාණය

ණය / අත්තිකාරම්	ණය දුන් සංඛ්‍යාව	ප්‍රමාණය (රු.)
උත්සව අත්තිකාරම්	96	480,000
විශේෂ අත්තිකාරම්	51	120,000
ආපදා හා පාපැදි ණය	100	3,368,834
එකතුව	**247**	**3,968,834**

5.3 2012 වර්ෂය සඳහා විගණකාධිපතිගේ විගණන විමසුම්

2012 වර්ෂය තුළදී, විගණන විමසුම් හතක් ලැබී තිබුණු අතර, සියලුම විගණන විමසුම් සඳහා සුදුසු පරිදි පිළිතුරු සපයා ඇත.